

# සත්‍යට සිත මෙහෙය වන්න

## සිත

"සිත" එය, මිනිසා ලත් සුවිශේෂී හැකියාවකි. එමෙන් ම, ආයතනයක් ලෙස ද ක්‍රියා කරන්නකි. අතීතයේ ඇතැම් යුගවල විසූ ධර්ම ගවේෂකයෝ සිත පිළිබඳ සොයන්නට උත්සුක වූහ. සැබවින් ම මේ අප ගත කරන්නේ ද එවැනි ම වූ කාලයකි. එය ඔබ නොදන්නවා විය හැක. එහෙත් මේ බුදුන් ජීවමාන කාලයයි.

## සිතක සැකසීම

අපි සිත දෙසට හැරෙමු. සැබවින් ම මේ සිත සකස් වූයේ කෙසේ ද? සිත ඇත්තේ කොහි ද? මම යනු චිත්ත ස්වභාවය ද? නැති නම් සිත සැදෙන්නේ මා තුළ ද? සිත එක දිගට ම පවතින දෙයක් ද? සැබවින් ම මෙතන බොහෝ ප්‍රශ්න ගොඩනැගෙන තැනකි. බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදය තුළින් මෙය විස්තර කර තිබේ. සැබවින් ම සිත නිසා විශාල මායාවක් ගොඩනැගේ. අවිද්‍යාව යනු මේ සිදුවන ක්‍රියාවලිය ගැන නොදන්නා ස්වභාවයයි.

## සිතිවිලි හැදෙන හැටි

සිත ගැන සත්‍යය නොදන්නා පුද්ගලයා තුළ සිතුවිල්ල ඇත්ත වීම, දෙයක් වීම, භවය හටගැනීම වැලක්විය නොහැක. දෙයක් වීම තුළ ම කෙනෙකු බිහි වේ. මේ ක්‍රියාවලිය සෑම සිතුවිල්ලක් පාසා ම සිදුවන්නකි.

ඉතා කුඩා බිළිඳාගේ, මූලික ආයතන පහේ ක්‍රියාකාරත්වය සිදුවනවා මිස සිතුවිලි හට ගැනීම සිදු නොවේ. මූලික ආයතන යනු ඇස, කන, නාසය, දිව, ශරීරයයි. මේවායේ දැනෙන ස්වභාවයක් ඇත. නමුත් ඒ මෙය යැයි හඳුනාගැනීමක් බිළිඳාගේ සිදු නොවේ. දැනෙන ස්වභාවය තුළ ද දෙයක් දැනෙන බව සිදු වේ. මෙය විඤ්ඤාණ ස්වභාවයයි. මෙයට හේතුව වනුයේ අවිද්‍යාව හා තණ්හාව යන ආරෝපණ ස්වභාවය ඒ තුළ තිබීමයි. මේ නිසා බිළිඳා තුළ ද ආයතනවල ඇලීමක ස්වභාවයක් පවතී. ඇසේ කම්පනය තුළ මෙන් ම අනිත් ආයතන හතරේ ද මේ ස්වභාවය පවතී. මේ බලය, එනම් ආරෝපණ බලය නිසා ම, මේ ආයතනවල කම්පන සියල්ල එකට කම්පනය වෙද්දී නව කම්පනයක් හට ගනී. ඒ සිතුවිල්ලයි.

## දුක හටගැනීම

කුඩා බිළිඳා ට ආලෝකය, ශබ්දය, රස, ගන්ධය, ස්පර්ශය තිබෙන්නා සේ, එනම් ඇති සේ දැනේ. තවත් ආකාරයකින් පැවසුව හොත් පවතින්නා සේ දැනේ. මේ බලය වටහා ගැනීමට බිළිඳා ට කිසිම අවස්ථාවක් නැත. මේ ආකාර බලයක් නිසා ආයතන එකට කම්පනය වීම තුළින් හටගන්නා සිතුවිල්ල තුළ ඇසේ උපත සිදු වේ. එනම් මනෝ විඤ්ඤාණය හට ගනී. බලය යැයි අප හඳුන්වන්නේ අවිද්‍යාව හා තණ්හාව යි.

වෙනත් ආකාරයකට මෙය ආත්ම කම්පනය ලෙස ද හැඳින්විය හැක. 'ඇපල්' යන සිතුවිල්ල හටගත් ආකාරය බලමු. මූලික ආයතනයන්හි කම්පනය තුළින්, එසේ නැති නම් දිට්ඨ, සුත, මුත යන ආයතනවල කම්පනය එකට එක් වී 'ඇපල්' යන චිත්ත කම්පනය, හෙවත් සිතුවිල්ල බිහි වෙයි. මේ සිතුවිල්ල බලය නිසා දෙයක් බවට පත් වේ. දැන් 'ඇපල්' තිබෙන ලෙස දැනේ. 'ඇපල්' නම් භවය හටගත් මොහොතේ ම පෙර පසු නොවී ජාතිය, එනම් ඉන්නවා මෙන් දැනීම හටගනී. මේ දුකේ ආරම්භයයි.

## දෘෂ්ටි හට ගන්නා හැටි

සිත සකස් වීම මේ බලයට අදාළ නැත. සිත හැම මොහොතක ම සකස් වේ. සිත කම්පනයක් බැවින් තිබෙන ස්ථානයක් පැනවීමට නොහැක.

සිතුවිලි නැවත නැවත කම්පනය වීම තුළින් දෘෂ්ටිය බිහි වේ. එනම් සිතන ආකාරය බිහි වේ. දහම නොදන්නා සිතන්නේ "මට සිතක් ඇත." "මගේ සිතේ විවිධාකාර සිතුවිලි හට ගනී." "එසේ සිතුවිලි නැගෙන ආකාරයට මගේ කය ක්‍රියාකාරී වේ."

මේ සාමාන්‍යය දහම නොදන්නා පුද්ගලයා සිතන ආකාරයයි. ඔවුනට සිතුවිලි බාහිර ඇති බව හැඟේ. ඒවා නිසා තමන් පෙළෙන බවක් හැඟේ. සිතුවිලි පහළ වන කෙනෙක් ඇති සේ දැනේ. කෙනෙක් ඉන්නා බවත්, කාලයක් ඇති බවත් මේ සිත තුළ දැනෙන ස්වභාවයයි. මේ දැනෙන ස්වභාවය නිසා දෘෂ්ටි බිහිවීම සිදු වේ. හැම විට ම දෘෂ්ටිය හෙවත් තිබෙන ආකාරය හටගන්නේ දැනෙන ස්වභාවය හෝ සිතන ස්වභාවය මත ය.

## සමනන්තරය

'ඇපල්' යන සිතුවිල්ල/චිත්ත කම්පනය - සුවඳක්, රසක්, ශබ්දයක්, රූපයක් හෝ දැනෙන ස්වභාවය තුළ හට ගනී. තවත් උදාහරණයක් ලෙස අම්මාගේ සුවඳ දැනෙන දරුවාට 'අම්මා' යන සිතුවිල්ල පෙර පසු නොවී හටගෙන අවසන් වේ. මෙසේ චිත්ත කම්පනය අනුනාද (ටෙලිපති) වීම මිස මතකය ගබඩා වූ තැනක් නොමැත. බුදුරජාණන් වහන්සේ මෙම සංසිද්ධිය සමනන්තරය ලෙස වදාළ සේක.

සිත යනු ආයතන ඔස්සේ අනුනාද වන කම්පන ස්වභාවයක් ම පමණි. සිත කියා දෙයක් නොමැත. මේ සිත යන කම්පන ස්වභාවයන් ටිකෙන් ටික වැටහෙන විට ඔබට එය බලයක් වීම අඩු වේ. පළමු ව සිදුවන්නේ හටගත්තේ සිතුවිල්ලක් ය යන බවත් එම සිතන දෙය එනම් ඒ සිතුවිල්ල බාහිර ඇති බව සිතා ගත්තා මිස, එසේ බාහිර නොතිබෙන බව ඔබට පසක් වීමයි.

'ඇපල්' කිසි දිනක නොකෑ බව සැබවින් ම ඔබට පැහැදිලි වේ. සිදු වූයේ දිවට රසයක් දැනීම හෙවත් දිවේ කම්පනයක් පමණි. මෙලෙස පසක් වෙද්දී සියලු සිතුවිලිවල බලය දිය වේ. සිතුවිලිවල සිර වූ ආත්ම කම්පනය/බලය/තණ්හාව දිය වී යන්නේ විද්‍යාව හඳුනාගැනීමෙන් ම පමණි. ඉහත ක්‍රියාවලිය විනිවිද දැකීම තුළ ම පමණි.

සිත සකස් වූ පසු, එය බාහිරට යොමු වූ පසු සැප, දුක, නින්දා, ප්‍රශංසා, හොඳ, නරක, උස්, මිටි, කමැති, අකමැති, ලස්සන, අවලස්සන ලෙස විශාල කතාවක් ගොඩනැගී හමාර වේ. එය විඳින ඔබ ද නිර්මාණය වී හමාර වේ. එහෙත් මේ සත්‍යය දකින්නා තුළ මේ මායාව ගැන කලකිරීමක් ඇති වේ.

## මායාව

සංඛත ධර්මයක් වූ සිත ඔබ මුලා කරන විශාල ම විජ්ජාව බව දැන ගන්න. එය විශාලතම මායාවයි. සිත සකස් වූ ආකාරය දකින ඔබට සිත දෙයක් වීම ටිකෙන් ටික අඩු වේ.

ආර්යයන්වහන්සේ විසින් ඉතා ම සරල ව, අප භාවිත කරන වචනවලින් මේ සිත සැදෙන ආකාරය විස්තර කිරීම නිසා සිත බල ගැන්වීම අඩු වී නැවතී යයි.

## මරණය ජය ගැනීම

කයවත්, සිතවත් ඔබ නොවේ. ඔබ ලෙස දැනෙන්නට හේතු වන්නේ, තිබෙනවා, ඉන්නවා යැයි ගනු ලබන බලය මත ගොඩනැගුණු ස්වභාවයකි. එම බලය දිය වී ගිය කල, එක් සිතුවිල්ලක දී ඔබට එම බලය නොමැති අනිදස්සන එනම් පතිත නොවූ විඤ්ඤාණය අත් දකින්නට ලැබෙනු ඇත. ඉන් සිදු වන්නේ, ඉන්නවා තිබෙනවා යැයි ගනු ලබන දෘෂ්ටිය බිඳ වැටීම ය. එපමණකින් ම ඔබ නැවත දුගතියකට නොවැටෙනු ඇත. මක් නිසා ද යත් එතැන් සිට සකස් වන සෑම සිතක ම කම්පනය වන බලය අඩු වී හට ගැනීම සිදුවන බැවිනි. මෙය ජීවත් ව සිටිය දී ම සිදුවන්නක් මිස සම්මුති මරණයෙන් මතු කතාවක් නොවන බව දත යුතු ය. මරණය ද සකස් වූ තවත් සිතුවිල්ලක් පමණි.

එන්න, අසන්න, මරණය මේ මොහොතේ ම ජයගන්න. අමරණීය වන්නේ එලෙසයි.

තෙරුවන් සරණයි !

**බුද්ධෝත්පාදෝ ශ්‍රාවක**




# නිවන් මඟට පිවිසෙමු

අපි කුඩා කල සිට ම පංච සීලයෙන් රැකවරණය ලැබීමට මහත් සේ ඇලුම් කෙළෙමු. මතකයේ ඇති කාලයේ පටන් පංච සීලය කියවෙන පාඨ ගාථාවක් සේ කටපාඩම් කරගනිමින් කටයුතු කෙළෙමු. "මම අද උදේ පන්සිල් ගත්තා" යැයි සිතමින් වෙහෙස ගෙන හෝ මෙනෙහි කළ අවස්ථා එමට පසු කෙළෙමු.

- **පාණාතිපාතා වෙරමණීසික්ඛා පදං සමාදියාමි**
- **අදින්නාදානා වෙරමණීසික්ඛා පදං සමාදියාමි**
- **කාමේසුමිච්ඡාචාරා වෙරමණීසික්ඛා පදං සමාදියාමි**
- **මුසාවාදා වෙරමණීසික්ඛා පදං සමාදියාමි**
- **සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණීසික්ඛා පදං සමාදියාමි**

- සතුන් මැරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
- නොදුන් දේ ගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
- කාමය වරදවා හැසිරීමෙන් වැලකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
- බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
- සුරාපානය කිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

යනුවෙන් මෙසේ කියමින් තමාගේ සිතින් මෙම කය පාලනය කර ගැනීමක් සිදු කරන ලදී. හුදෙක් මෙය තම සිත මෙලෙස යම් රාමුවකට කොටු කර ගැනීමකි.

මෙලෙස බුදු දහමේ ඉගැන්වෙන පංච සීලයක් අනුව වැලකීම ද, ඒ අනුව එය සමාදන්වීම ද ප්‍රධාන අංගයක් කොට තිබිණි. බෞද්ධයකු වීමට නම් පංච සීලය ආරක්ෂා කළ යුතුව ඇත. හෙවත් බෞද්ධයකුගේ නිත්‍ය ශීලය පංච සීලය විය. ඒ අපගේ පැරණි දැණුමයි.

එසේ නොවන අයකු වේ නම් හෙතෙම දුශ්ශීලයකු සේ හැඳින්විණි. සැබවින් ම පංච සීලයෙහි ප්‍රධාන අරමුණ බෞද්ධයා වරදින් මුදවා ගැනීම ය. සිල් සමාදන් වීම නම්, එම වැරදි රාශියෙන් පුද්ගලයා මුදවා යහපතෙහි යෙදවීම ය.

මෙසේ වූ පංච සීලය අද වන විට සියලු ම ආගම් සමාජීය යහපත උදෙසා පවත්වා ගනිමින් කටයුතු කරන බව පැහැදිලි ය. මේ අනුව සමාජය විසින් පංච සීලය දිගු කාලයක් රැකගෙන පැමිණ ඇත. අද වන විට අප බෞද්ධය ජනතාව පංච සීලය ආරක්ෂා කරමින් දිව්‍ය ලෝක සැප සම්පත් බලාපොරොත්තුවෙන් මිත්‍යාව පසුපස ගමන් කරමින් සිටින බව පැහැදිලි ය.

පංච සීලය සැලකීමේ දී මෙය කරන්නා වූ පුද්ගලයෙක් ද, කරන්නට දෙයක් ද හමු වී ඇත. එය නිවැරදි නිවන් මාර්ගයේ යන පුද්ගලයාට වෙනස් ම අත්දැකීමකි. මෙය නිවැරදි දර්ශනය නොමැතිකම නිසා සමාජය නොමඟ යැමකි. සමාජයට ම සිදු වූ හානියකි.

කෙනෙක් පුද්ගලයෙක් හමු නොවන තැන මැරීමට කෙනෙකුත් හමු නොවේ. ගැනීමට දෙයක් ද හමු නොවේ. පංච ඉන්ද්‍රියයන් පිනවීමක් ද හමු නොවේ. බොරු කීමක් ද, ඊට කිසියම් දෙයක් ද හමු නොවේ. රහමෙර විඳීමට හෙවත් මත්වීමට ද දෙයක් හමු නොවේ. එසේ නම් කවර කතා ද? අංගුලිමාල මහරහතන් වහන්සේගේ කතා පුවත මෙයට හොඳම උදාහරණය සපයි.

ඒ අනුව මින් ඉදිරියට තිබෙන්නා වූ සියලු සීලයන් ආරක්ෂා කිරීම හෝ සමාදන් වීම නිරයාසයෙන් සිදුවන්නක් වනු ඇත. එනම් දෙයක් නොමැති තැන කෙනෙක් හමු නොවේ. කෙනෙක් නොමැති විට සියලු ම සීලයන් ඉබේ ම රැකෙන බව අත්දකිනු ඇත. අප මීට ඉහත දැක, දැන තිබූ බුදු දහම දැන් නව ආකාරයකින් සැබෑවට ම පෙනේ. පෙර සිටි බෞද්ධයාට බුද්ධ දර්ශනය නම් වූ බුදු දහමේ වැසී ගිය අනර්ඝ වූ කොටස නැවත හමු වී තිබේ.

මෑත යුගයේ බෞද්ධයන් වන අපට මේ දර්ශනය නම් වූ සත්‍ය ඥාණය නැවත හමුවීමත් සමඟ ම සමස්ථ බුදුනු සමාජය නව මාවතකට ප්‍රවේශ කොට තිබේ. මෙහි දී සත්‍ය ඥාණය, කෘත්‍ය ඥාණය, කෘතඃ ඥාණය යන සන්ධි ස්ථාන තුන ම ඉතා පැහැදිලි අයුරින් බෞද්ධයා ට හඳුනා ගත හැක. ඒ අනුව පංච සීලය ද නිවැරදි අයුරින් දැක, නිවන කරා යාමට අවස්ථාව ලැබී ඇත.

දර්ශනය නිවැරදි නම්, යන මාවත ගැන කවර කතා ද? අප මෙපමණ කාලයක් ඉතා අමාරුවෙන්, දැඩි වෙහෙසක් ගෙන ආරක්ෂා කළ, පංච ශීල ප්‍රතිපත්තිය සහ එමඟින් තර වූ 'මමයා' ක්ෂය වන්නා වූ ධර්මතාව තුළ අප අභ්‍යන්තරයේ ගොඩනැගෙන නිබ්බිදාවත් සමඟ ම පංච සීලයට වෙන ම අර්ථයක් දැන් දැන් ගොඩනැගෙන බව වැටහේ. ඒ බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ පෙන්වා දෙන සැබෑ නිවන් මග ඔස්සේ ය.

තව දුරටත් අප පංචශීලය පමණක් උපාදාන කරගනිමින් ආරක්ෂා කිරීමට වෙහෙස විය නැත. එය අප අභ්‍යන්තරය තුළින් නිරායාසයෙන් ම ආරක්ෂා වේ. ධර්මය දකින්නා ධර්මයෙන් ම ආරක්ෂා වන්නා සේ මේ 'සිතුවිල්ල' සැකසෙන ආකාරය දුටු කල එය දකින පුද්ගලයා නිරායාසයෙන් ම නිවනට ම ගෙන යනු ලබන නිරායාස සොබා දහමට හසුවන බව පැහැදිලි ය.

තෙරුවන් සරණයි!

බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේට
මාගේ නමස්කාරය වේවා!

**කාංචනා පෙරේරා**
බත්තරමුල්ල

# නිස්සරන මග TV දේශනා

තුන්වන කොටස

"නාමරූප පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණය කියන්නේ දැන ගැනීමනේ. විඤ්ඤාණය කියන එක අනිත් පැත්තට එනවා නාමරූප කියලා. දැනගත්ත දේකට නමක් කියනව, නමක් අනුව රූපයක් එනවා, රූපයක් අනුව නමක් එනවා දෙපැත්තට මාරු වෙනවා. මෙතන මෙහෙම කියන්නේ, ගියපාර අපි දෙයක් හටගන්න තැනින් නැවැත්තුවා. නමුත් ඒ කතාව එතනින් අවසාන වෙන්නේ නැහැ. මේ කතාව තව දිගට තියෙනවා.

"යං සංචානාති තං විතක්කේති" සංඥාවට විතර්ක කරලා දැනගැනීම තමයි "යං විතක්කේති තං විජානාති". දැනගැනීම විජානාති. එතකොට ඒ දැනගත්ත දේ, අපි නැවතත් බාහිර ආයතන ටික හදාගෙන බාහිරින් හොයනවා. ඒ හැඩතලේ තියෙන එක තව කොහේ හරි දැක්කොත් ඒ කලය, ඒක තමයි කළය කියන්නේ. තව කොහේ හරි දැක්කොත් ආ ඒ ඒක ෂර්ට් එක. අපි මේ විදිහට අපි නැවතත් බාහිරයට යනවා. ඒකයි විඤ්ඤාණ පච්චයා නාම රූප.

අපි පෙළ අනුව කියනවා, වේදනා සංඥා චේතනා ඵස්ස මනසිකාරය අපි නාමය හඳුන්වනවා. අපි නාමය හඳුන්වන්නේ වේදනා සංඥා චේතනා ඵස්ස මනසිකාරය. එහෙමනම් මෙතන මේ මනසිකාරය කියලා ගන්නේ, ඵස්ස කියලා ගන්නේ ඔබට තේරෙනවා දැන් මේ මෙතන විතර්ක කරල ගන්නේ, ඒ හදාගත්ත දැනගැනීම. එතන තමයි අපි වේදනා සංඥා, සංඛාර විඤ්ඤාණ කියලා ඔය පංච උපාදානස්කන්ධය කියලා ස්කන්ධය පැහැදිලි කරනවා. ඒ ස්කන්ධය පැහැදිලි කරනකොට රූප වේදනා, සංඥා සංඛාර විඤ්ඤාණ පංචස්කන්ධය, ස්කන්ධය. ඒ ස්කන්ධය කියන්නේ ඵලයක්. මේක හේතු නිසා හටගත්ත ඵලයක්. ඒක හැමෝටම විපාකයක්. මේ ස්කන්ධය හැමෝටම පොදුයි. ස්කන්ධය නැති කරන්න බැහැ. නමුත් මේ ස්කන්ධය අපි උපාදාන කරගන්නවා. ස්කන්ධය නිසා අපි මේ හදාගත්ත දේ, දෙයක් හදාගන්නවා. නම් පැනවීමක් කරනවා .එතකොට මේ අපි පනවගත්ත දේ නැවතත් අපි බාහිරයෙන් හොයනවා. නාමයක් නිසා රූපය එකතු කරගෙන, නාමයයි රූපයයි එකතු කරගෙන අපි විසින්ම හදා ගත්තා. විඤ්ඤාණයක් දැනගැනීමකට අපි ආවා. එතකොට මේක මනසිකාරයක්. මනස ඇතුළෙමයි. ප්‍රඥප්තියකට හැඩතලයකට විතර්ක කරලයි මේ දැනගැනීමට ආවේ. එතකොට මේ දැනගත්ත දැනගැනීම මනසිකාරයෙන් නැවත අපි බාහිරයට බලන එක, ඒ විඤ්ඤාණ පච්චයා නාම රූප.




"නාමරූප පච්චයා විඤ්ඤාණ" - "විඤ්ඤාණ පච්චයා නාමරූප" නැවත බාහිරින් රූපය දකිනකොට නැවත අපිට නාමය සිහි වෙනවා නාමය ඇහෙන කොට රූපය සිහිවීමත්, රූපය දකිනකොට නාමය සිහිවීමත්, මෙතන හොඳින් අපි දකින්න ඕනේ. මේ කතාව කොහොමද සිද්ධ වෙන්නේ කියලා.

ඉදිරිපත් කරනකොට පුංචි පුංචි අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. නමුත් ඊට වැඩිය වැදගත් පැහැදිලි කරන කාරණාව ගලපගන්න එක. අපි දැන් මේ ගැන ගොඩාක් කථාකළා. ඔබට මේක හොඳින් අවබෝධ වෙන්න ඕන තැනක්. රූපයෙන් මිදෙනවා කියන්නේ අනාගාමි මට්ටමටම ඔබට යන්න පුළුවන් තැනක්. සක්කාය දිට්ඨිය බිඳ වැටෙන තැන, සක්කාය දෘෂ්ටිය හැදෙන තැන, දෘෂ්ඨිය ඍජු කරගන්න ඕනේ. ඒ කියන්නේ නිවැරදි දැක්ම ඇති කරගන්න ඕනේ.

මායාව තියෙන තාක් ඔබ විචිකිච්චාව සැකයකින් ඉන්නේ. ඔබ සැකයෙන් මිදෙන්න ඕනේ.හැබැයි ඔබට සත්‍ය දැනගන්න තාක් කල් ඔබට සැකයෙන් මිදෙන්නට හැකියාවක් නැහැ. ඔබ සත්‍යය අවබෝධ කරගන්න ඕන.

දැන් අපි මේ කායානුපස්සනාව කොටසේ, ඔබ දන්නවා ආනාපානසති භාවනාව. නිමිත්තට හිත තබාගන්න එක."පරිමුඛං සතිං උපට්ඨපෙත්වා". මේ ගැන අපි කථා කරමු තව ඉස්සරහට.

ඒ වගේම ධාතු මනසිකාරය සතර මහා භූත ධාතු ස්වභාවය ගැන. ඒ වගේම රූප ධාතු, චක්ඛු ධාතු, චක්ඛු විඤ්ඤාණ ධාතු. ධාතු අවබෝධ කරගන්න ඕනේ. බාහිර තියෙන හතර මහා භූත ධාතු පඨවි, ආපෝ, තේජෝ, වායෝ. අපේ ඇස හැදිල තියෙන්නෙත්, ඒ ආයතන කියන අපේ මේ ආයතන කියන ඉන්ද්‍රියන් හැදිලා තියෙන්නෙත් හතර මහා භූත වලින් නම්, ධාතු ධාතුත් සමග ගැටීමක් නේද මෙතන සිද්ධ වෙන්නේ කියන එක. ධාතු ධාතු ගැටීම නිසා හටගත්ත ඵලයත් එහෙමනම් ආත්මීය එකක් වෙන්නේ කොහොමද කියන එක.

මේක හොඳට පැහැදිලි වෙනවා, කුඩාම අංශුව බාහිර අපි විද්‍යාවෙන් දැක්කොත් අද කියනවනෙ පරමාණුව කියල. ඒක කුඩාම අංශුව නම් ඇස කියන එක කුඩාවටම කඩලා ගත්තහම මොකක්ද ඉතුරු වෙන්නේ. එහෙම නම් ඒකත් පරමාණුව. පරමාණුව පරමාණුවක්මයි. එහෙනම් මේ රූපය කියලා ගත්තත් මොකක්ද වෙන්නේ ඒත් පරමාණුවක්මයි. ආලෝකය කියලා ගත්තත් මොකක්ද වෙන්නේ? ඒත් අංශු වලට කඩලා ගත්තත් ධාතු ස්වභාවය ධාතු ස්භාවයක්මයි. ධාතුව ධාතු සමග ගැටිලා හදන ඵලය ධාතුවක්මයි. ධාතු මනසිකාරය කරනකොට, ඔබට මේ ධාතු වලින් පිරුණු ලෝකයක් දැනෙනවා. ඒත් ඔබට සිද්ධ වෙන්නේ කායේ කායානුපස්සී විහරති. කය කය අනුව බලමින් අත්හැරීමක්. දෙයක් හමුවන්නේ නැහැ. ලෝකයෙන් විදීමක් මිදීමක්. "විනෙය්‍ය ලෝකේ අභිජ්ඣාදෝමනස්සං". විනෙය්‍ය ලෝකේ කියන්නේ ලෝකයෙන් මිදෙනවා. අභිජ්ඣාදෝමනස්සං කියන්නේ කාමයත්, ගැටීමත්, පටිඝයත්, ද්වේශයක්. ඇලීමක්, ගැටීමක්, අවිද්‍යාවත්, දෝමනස්සයත්.

ඉතින් මේවා බොහෝම නිරවුල් බොහෝම පැහැදිලියි හොඳට අවබෝධයක් තියෙන්න ඕනේ. මේ ලෝකයෙන් මිදෙන එක අපි මේ නිකන් මේ පොතකට ඉගෙන ගන්න යන එකක් නෙමෙයි. අපේ ජීවිතයේ විඳිමින්, අපි සත්‍යය අවබෝධ කරගන්න එකක් මේ ගමන. එහෙම නම් මේ මායාව හඳුනන, මායාව කියන්නේ මේ අපි දකින ලෝකයේ මේ අපි ඉන්න ලෝකය මේ අපි සත්‍ය දැනගන්න එක. අපේ ජීවිතය ගැන මේ කතා කරන්නේ. ඒක අපිට හුගාක් වැදගත් කතාවක්. අපි මේ සත්‍යය අවබෝධ කරගන්න ඕනේ. අපි එයින් මිදෙන්න ඕනේ.

ඉතිරි කොටස මීලග සඟරාවෙන්.
තෙරුවන් සරණයි!

**බුද්ධෝත්පාදෝ ශ්‍රාවිකා**




# සිතන්නට යමක්

ජීවිතය යනු, ආයතන හය පිනවමින් නැවත නැවත ඉපදීමේ චක්‍රයකි. ඉතා කෙටි ආයු කාලයක් ඇති මිනිස් ජීවිතය තුළින් ළදරු, ළමා, මහලු අවදීන් අතහැර දැමූ විට ඉතිරි වන්නේ වසර කිහිපයක් පමණි. ඉතින් අප මේ ගත කරන වසර කිහිපය තුළ වෙනත් අයෙක් එසේත් නොමැති නම් සමාජයක් වෙනස් කිරීමට දැරීම ව්‍යාජ උත්සාහයකි. මන්ද සමාජයෙහි ජීවත්වන සත්ත්වයින් විවිධ මත දරන්නන් වන බැවිනි. ලෝකයක් වෙනස් කිරීමට නොගොස් තමන් විසින් තමන්ව දැන දැක වෙනස් වීමට උත්සාහ දැරීම කළ හැකි හොඳම කටයුත්ත ලෙස මට දැනේ. මෙලෙස එකිනෙකා විසින් ම තමා තුළින් තම තමන් දැකීම ආරම්භ වීමත් සමඟ කිසිවෙකුටත් ලෝකයක් වෙනස් කිරීමට අවශ්‍ය නොවනු ඇත.

තව ද මේ බුද්ධෝත්පාද කාලය තුළ ඔබට කල්‍යාණ මිත්‍රයෙකු විය හැකි නම් එය අති උත්තරීතර කටයුත්තකි. එවිට ඔබට තවත් අයෙකුට සත්‍ය ධර්ම මාර්ගය පෙන්වා දිය හැකිය. එය අති උතුම් සත්ක්‍රියාවක් බව නැවතත් කියමි.

අවසානයේ දී සියලු ම සත්වයින්ගේ දුකෙහි කෙළවර වන්නේ ආයතන හයෙහි පිනවීමේ නිමාවයි. මේ අවසානය උතුම් වූ "නිර්වාණය" ලෙස හඳුන්වයි.

තෙරුවන් සරණයි !

**එස්. නිශාන්ත**

බේරුවල

# ගති නිමිති සහ කම්ම නිමිති දකිමු

(න නිමිත්තග්ගාහි න අනුමිත්තග්ගාහි)

බුදුන් වහන්සේ වදාළ මේ ගාථා පාඨය දුකින් මිදෙන්නට නිවන් දකින්නට උපකාර වනවා. එහි සරල තේරුම නිමිති, අනුනිමිති නොගත යුතු බවයි. අවබෝධ කර ගැනීමට පහසුව පිණිස මුලින් උපමා කතාවක් ගෙන බලමු.

එක්තරා නිවසක මවක් සහ ඇයගේ දෙහැවිරිදි පුංචි පුතු වාසය කළා. මේ අතර දිනක් අහස ගොරවමින්, අකුණු ගසමින් මහා ධාරාණිපාත වර්ෂාවක් ඇද හැලෙන්නට පටන් ගත්තා. එවිට දරුවා මිදුලට පැන දෑත් ඔසවා ගෙන, සිනාසෙමින්, ප්‍රීතියෙන්, හඬ නගමින් තෙමී තෙමී මිදුල පුරා දුවන්නට වුණා. දරුවාට අපමණ කෙළිලොල් ප්‍රීතියක් දැනෙන්නට වුණා.

මෙය දුටු මව කෝටුවකුත් රැගෙන මිදුලට පැන "පුතා, වහිනවා, අකුණුත් ගහනවා. තෙමෙන්න එපා, අකුණක් වැදිලා මැරෙන්න ද හදන්නේ?" යි, කියමින් දරුවා පිළිබඳ මහත් වූ හැඟීම් පෙර දැරිව ඔහු පසු පස එළවන්නට පටන් ගත්තා.

දැන් දරුවා සහ මව තෙමෙමින් මිදුල පුරා දුවනවා. වැස්සේ තෙමෙන විට දැනෙන සිසිලස දරුවාට ලොකු සතුටක්. ඒ වැස්සට ම තෙමෙන අම්මාට ඇත්තේ දුකක්. අම්මාගේ සිත ගිනි ගන්නවා. එක ම වැස්සක තෙමීමෙන් කෙනෙකුට සතුටක් දැනෙන විට තවත් කෙනෙකු ගිනි ගන්න පුළුවන් ද? දැන් උපමා කතාව පසෙක තබා ගාථාවේ අරුත ගැඹුරින් විමසමු.

දරුවා ඒ මොහොතේ වැස්ස කියන නිමිත්ත නොමැති ව තමාට දැනෙන ගතිය අත්වින්දා. එය දැනුමක් නොව දැනීමක්. මව ගතියට නිමිත්තක් දාගෙන දැනුම හරහා සකස් වූ නිමිත්ත අත්වින්දා. ප්‍රභාෂ්වර සිතක් තිබෙන දරුවා සේ සතුටින් සිටින්නට නම් නිමිති අතහැර ගති ස්වභාවයන් අත්විඳින්නට දක්ෂ විය යුතුයි. ගාථා පාඨයට අනුව බුදුන් වහන්සේ වදාළ පරිදි කෙසෙල් ගසක හරයක් නැති වා සේ නිමිති, අනුනිමිති ද හර සුන් බව දත යුතුයි. නිමිති, සිතිවිලි, සංකාර, අරමුණු යන වචන සියල්ලේ ම ඇත්තේ එකම අර්ථයයි. නිමිති දුක් සහගත බව **"සබ්බේ සංකාරා දුක්ඛාති"** කියා බුදුන් වහන්සේ වදාළේ එබැවිනි.




සුදු රෙදි කඩක් වාගේ ප්‍රභාෂ්වර සිතක් තිබෙන පුංචි දරුවාට පෙර පාසල් වියේ දී නිමිති, දත්ත එකතු වී සිත කිලිටි වන්නට පටන් ගන්නවා. වැස්සට තෙමුණ දරුවාගේ සිතේ වැස්ස, තෙමීම, ලෙඩ, අකුණු, මරණය යන නිමිති නොමැති නිසා එයාට වැස්සේ සුවයක් දැනුනා. අම්මාගේ සිතේ වැස්ස, තෙමීම, ලෙඩ, අකුණු, මරණය සහ දරුවා යන නිමිති මෙන් ම අනුනිමිති ද තිබූ නිසා ඇය ගිනි ගත්තා. මේ ගින්න නිවෙන එක තමා නිවන.

දැන් අපි බලමු නිමිති යනු සිතිවිලි නම් ගති කියන්නේ මොනවා දැයි කියා. බුදුන් වහන්සේ වදාළේ සියලු ම ජීවී අජීවී රූප සකස් වී ඇත්තේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ නම් සතර මහා ධාතු ශක්තියකින් කියා. නමුත් අපේ ඇස්වලට සතර මහා ධාතූන් පෙනෙන්නේ නෑ. එසේ නම් කෙසේ ද අප සතර මහා ධාතු ශක්තිය හඳුනාගන්නේ. සතර මහා ධාතුව ගෝචර වන්නේ අපගේ කය ආයතනයට පමණි. සතර මහා ධාතුවේ ගුණ කයට දැනෙනවා. පඨවි ධාතුවේ ගුණ තමා තද බව සහ මෘදු බව. ආපෝ ධාතුවේ ගුණ තමා වැගිරෙන බව. තේජෝ ධාතුවේ ගුණ උණුසුම හා සිසිලස. වායෝ ධාතුවේ ගුණය හමා යන ගතිය.

මෙහි එන දරුවාට දැනුනේ තේජෝ ධාතුවේ අඩු ස්වභාවය වන සිසිල් ගතියයි. එය දැනුන කිසියම් පුද්ගලයකු සිටියේ නෑ. එහෙත් අනාත්ම වූ කාය විඤ්ඤාණයට එය දැනුනා. එතන විඳින්නෙක් සිටියේ නෑ. ගතියට නිමිත්ත ගැට ගසා මනෝ විඤ්ඤාණය තුළ සකස් වූ මායාව නිසා මව ගිනිගත්තා.

බුදුන් වහන්සේ සතර සතිපට්ඨානය දේශනා කරන ලද්දේ ආයතන තුළ සකස් වන කම්පනය අනාත්ම වූ ක්‍රියාවලියක් බව පෙන්වීමට ය. එසේ ම බුදුන් වහන්සේ උදාහරණයක් දක්වමින් පියාගේ ඊ කවරණයේ වාසය කළ කැටකිරිල්ලිය උකුස්සාගෙන් බේරුණා සේ සතර සතිපට්ඨානය තුළ අපට ඊ කවරණය ඇති බව පෙන්වා දුන් සේක.

බුදුන් වහන්සේ **"නවකිංචි ලෝකෝ උපාදියති"** යනුවෙන් පෙන්වා දුන්නේ මේ ක්ෂණය අත්දකින්නාට උපාදාන, කෙලෙස්, කර්ම සකස් නොවන බව ය.

දරුවා යනුවෙන් ඇස ට වැටෙන්නේ වර්ණ සටහනකි. හැඩ තලයකි. ප්‍රතිබිම්බයකි. කනට ඇසෙන්නේ ද ශබ්දයකි. එතන ද දරුවෙක් නොමැත. නාසයට ගඳ, සුවඳ නොව දැනීමක් පමණි. දිවට පැණි රස හෝ තිත්ත රස නොව දැනීමක් පමණි. කයට ද උණුසුම, සිසිලස හෝ තදගතිය නොව දැනීමක් පමණි. මනසට ද දරුවෙක් නැත. අරමුණක් පමණි. මේ දැනෙන ගති ස්වභාවයට නමක්, නිමිත්තක් එක් කොට අනාත්ම වූ ලෝකය ආත්මීයව ගන්නා නිසා (සිතන නිසා) සසර ඕඝය සකස් වේ.

ආයතන හරහා සිත සකස් වන ක්‍රියාවලිය අත්දකින විට බාහිර ලෝකයෙන් මිදී සිතේ සකස් වූ ලෝකය ද හරසුන් බව දක්නා විට ආත්මදෘෂ්ටිය ගිලිහී යයි. ආර්යයන්වහන්සේ නිතර දේශනා කරන පරිදි න පඨවි, න ආපෝ, න තේජෝ, න වායෝ ආදී වශයෙනි. ඉන් පැහැදිලි වන්නේ සතර මහා ධාතු කියා දෙයක් තිබෙන නිසා අපට අරමුණු සකස් වනවා නොව අප ඒවා තිබෙනවා කියා සිතන නිසා (ගන්නා නිසා) අපට අරමුණු සකස් වන බවයි. අප සිතන්නේ යමක් ද එය බාහිරයේ ඇති බව විඤ්ඤාණ මායාවෙන් මවා දෙයි.

**"දිට්ඨේ දිට්ඨ මත්තං භවිස්සති"** යනුවෙන් දාරුචීරුයට පෙන්වා දුන්නේ නිමිති නොමැතිව ගතිය අත්දකින ආකාරයයි.

ගතියට නිමිති එක් වූ විට ගති නිමිති සකස් වනවා. ක්‍රියාවට නිමිති එක් වූ විට කර්ම නිමිති සකස් වනවා. පෘතජ්ජනයාට ගති නිමිති, කර්ම නිමිති සකස් වන නිසා සසර සකස් වනවා. නිමිති ඇති විට විපාක සිත් හට ගන්නවා. රහතන් වහන්සේලා නිමිති ඇසුරු නොකර ක්‍රියාවලිය අත්දකින නිසා ක්‍රියා සිත් හට ගන්නවා. එතන කර්ම, කෙලෙස් හට නොගන්න නිසා කම්මකඛියෝ නිබ්බානං කියන ස්වභාවය සකස් වනවා. ඒ නිබ්බානය හෙවත් නිර්වාණය යි.

තෙරුවන් සරණයි!
බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේට නමස්කාර වේවා!

**වටරැක බුද්ධෝතපාද ශ්‍රාවකයෙකු විසිනි.**

# බුද්ධෝත්පාදෝ
## කල්‍යාණමිත්‍රත්වය
## හඳුනාගන්න" ධර්මය "තුලින්



බෞද්ධයෙක් වන " ප්‍රතිපදාව "
ප්‍රායෝගිකව අත්දකින්න
ඇවිත් බලන්න
බුද්ධෝත්පාදෝ ආයීන් වහන්සේ

**පෙර නොඇසූ,,විරූ දහම,**
**අසා, දැන, දැක ගන්න**

# මොහොතක් නැවතී සිතන්න

ඔබ බහ තෝරන වියේ සිට ඇසෙන ධර්මය තුළ නිවන් දැකිය හැකි මාර්ගයක් දුටුවෙහි ද? එවන් මඟක් ඔබේ අභ්‍යන්තරයේ සකස් වී ඇති ද? මොහොතක් සිතන්න.

බලන්න. ඔබ ජීවිත කාලය තුළ කොපමණ දින ගණනක් වාඩි වී බුදුරජාණන් වහන්සේ දේශනා කළ දහම යැයි කියා නොයෙකුත් දේශකයාණන් වහන්සේලාගේ කතා ශ්‍රවණය කරන්න ඇති ද? ඒ ඇසූ දහම නිවන් දැකීම පිණිස යැයි කීව ද භවය සකස් කරන කර්ම භූමියේ යන මාර්ගයක් නොවේ ද? සැබවින් ම අපට ඕනෑ නිවන් දකින්න. එසේ නම් අපි නිවන් මගක ගමන් කළ යුතු ය. එසේ නම් අනිවාර්යෙන් ම කර්ම භූමියෙන් මිදී හේතුපල දහම තුළ ගමන් කළ යුතු ය. නිවන් මාර්ගයේ මුල, මැද, අග පැහැදිලි ව ඔබට දැකිය හැකි විය යුතු ය.

එවන් වූ සත්‍ය ම මාර්ගය දැන් විවර වී තිබේ. ඒ බුද්ධෝත්පාද දේශනා ය. බුද්ධෝත්පාද දේශනා තුළින් අපූරු දේශනා ප්‍රාතිහාර්යයක් සිදු වේ. එහි නිවන් මාර්ගයේ මුල, මැද, අග මනාව ගැලපී ඇත. ඔබේ සියලු දහම් ගැටළුවලට විසඳුම් ඉදිරිපත් වේ. සැබවින් ම අසිරිමත් ය. ඔබට සසර ඕසයෙන් නිදහස් වීමට ඇති එක ම මාර්ගය එය බැව් කිව යුතු ය. ඇස් ඇත්තෝ ම දකිත්වා!

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඒ සත්‍ය දහම අවබෝධ කර අත්දැකීම් සහිත ව ප්‍රත්‍යක්ෂ ඥානයෙන් බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ දේශනා කරන සේක. හේතුපල දහම මැනවින් ගලපා සම්මාදිට්ඨියට පැමිණීම ට මග විවර කරන සේක. මෙතෙක් සිටි කර්ම භූමියෙන් මිදෙන ස්වභාවය ප්‍රායෝගිකව අත්දැකිය හැකි අයුරු දේශනා කරන සේක. දේශනා ශ්‍රවණය හා ප්‍රායෝගිකව තමා තුළින් ගළපා එය විදර්ශනා ඥානය තුළ සත්‍ය දකින ආකාරය බුද්ධෝතපාද ආර්යයන්වහන්සේගේ දේශනා තුළ ගැබ් වේ. "සළායතන නිරෝධෝ නිබ්බානෝ" යන්න ප්‍රත්‍යක්ෂ කරයි.

බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ මේ දේශනා මාලාව මුල සිට පෙළගස්වා ඇත්තේ ඕනෑ ම කෙනෙකුට දහම් අවබෝධ වී ඒ තුළින් නිවීම අත්දැකීමට හැකි ක්‍රමානුකූල සැලැස්මක් අනුව ය. ඒ නිසා දේශනා අසන ශ්‍රාවකයින්ගේ රාග, ද්වේශ, මෝහ කෙලෙස් ක්ෂය වන බව ඔවුනට ප්‍රත්‍යක්ෂ වේ.

බුද්ධෝත්පාද දේශනා ශ්‍රවණය කිරීමෙන් පළමු ව බුද්ධ දර්ශනය පිළිබඳ පැහැදිලි වැටහීමක් ඇති වේ. දේශනා මාලාව ශ්‍රවණය කිරීම හා ප්‍රතිපදාව තුළ බුදුරජාණන් වහන්සේ දේශනා කළ දහම තුළ ඇති සත්‍ය තමා ට ම ප්‍රත්‍යක්ෂ වීම එක්තරා අනුපිළිවෙළකට සිදුවන ආකාරය දැකිය හැකි වේ.

පළමු ව අපට පෙනෙන, ඇසෙන, දැනෙන සියල්ල ශබ්ද වර්ණ කියා අවබෝධ වේ. ඒ අවස්ථාවේ දී මෙතෙක් අප බාහිර ලෝකයට දී තිබූ වටිනාකම පැහැදිලි වේ. ඒ ඒ වටිනාකම් නැවත නැවත තමා තුළ චිත්ත අභිසංකරණයකට ලක් වී ලෝකය සකස් වූ බව පසක් වේ. සසර ගමන් කිරීම සිදු වනුයේ එවිට ය. මේ ශබ්ද, වර්ණ පිළිබඳ අවබෝධයත් සමඟ ශබ්ද, වර්ණ නිසා සැකසෙන සිතුවිලි ලෝකය සැබෑවක් යැයි

ගැනීමෙන් සසර ට ඇද වැටෙන බව අවබෝධ වේ.

ශබ්ද, වර්ණ, හැඩතල තුළින් සැකසෙන ලෝකය ඒ ඒ පුද්ගලයන්ගේ අභ්‍යන්තරයේ නිර්මාණයක් බව අවබෝධ වීමත් ඒ තුළින් බාහිර අභ්‍යන්තරය අප තුළ සකස් වූ ආකාරය දැකීම තුළින් මේ මායා ලෝකය හඳුනා ගැනීම මූලික ව සිදු වේ. දිගින් දිගට ම බුද්ධෝත්පාද දේශනා ඇසීමෙන් සත්‍ය මනස තුළ තහවුරු වේ. සිතුවිලි ලෝකය තුළ ඇති මායාව දැක ගැනීමට හැකි වේ.

වෙනත් දේශනාවල මෙන් නොව බුද්ධෝත්පාද දේශනා ශ්‍රවණය කිරීම තුළින් සත්‍යය අවබෝධ වේ. කර්ම භූමියෙන් මිදී හේතුපල දහම තුළ ගමන් කරන ආකාරය තමන්ට ම දැක ගත හැකි වනු ඇත.

කම්පන වේගයට සකස් වන අරමුණු (සිතුවිලි) කුඩා කල සිට අභිසංකරණය වූ ආකාරය ඒ තුළින් ඇති වූ රාග, ද්වේශ, මෝහ ගින්න බලවත් වී "මම" යන සංකල්පය ගොඩනැගී සසර සැඩ පහරට හසු වේ.

මේ මොහොතේ මේ සිත සැකසෙන ආකාරය දකීම තුළින්, අප මේ දක්වා ගොඩනඟා ගෙන තිබූ අතීත, අනාගත, වර්තමාන යන කාල තුන ම බොරුවක් බව අවබෝධයට පත් වේ.

සකස් වන සිතුවිලිවල දෘෂ්ටිගත වීම්වල මිදීමක් ඇති වේ. මේ මාර්ගය තුළ තම ආත්මය හොඳින් දැනෙන්නට පටන්ගනී. ඒ නිසා දහම් මාර්ග යේ ගමන් කිරීම වඩාත් පහසු වේ. ජීවිතය සැහැල්ලු සැනසිලි දායක බවකට පත් වේ. මේ අවබෝධය සිතුවිල්ලකින් කළ නොහැක.

බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ දේශනා කරන්නේ පරම නිර්මල සත්‍යයකි. ආර්යයන්වහන්සේ මේ විශ්වයේ සියලු කම්පන අභිබවා අකම්පන ස්වභාවය තුළ මුළු විශ්වය ම දකිමින් දස දහසක් ලෝක ධාතුව කම්පා කරමින් මිනිස් සිතට දැකිය නොහැකි ස්වභාවයක් අපට දේශනා කිරීම ම මහා ආශ්චර්යයකි. මේ ධර්මතාවය ලෝකයට දේශනා කරන ඔබ වහන්සේට නිරෝගී සම්පත්තිය ලැබේවා.

තෙරුවන් සරණයි !

**කෑගල්ලේ චන්ද්‍රිකා බණ්ඩාර**




# අරහත්ත සූත්‍ර

අරහත්ත සූත්‍රය සංයුක්ත නිකායේ තුන්වෙනි කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ පහළොස් වැනි ග්‍රන්ථය ස්කන්ධ සංයුක්තියෙහි ඛජ්ජනීය වග්ගය අරහත්ත සූත්‍රය එකසිය හතලිස් පස් වෙනි පිටුව

මහණෙනි, රූපය අනිත්‍යයි, යමක් අනිත්‍ය ද, එය දුකයි, යමක් දුක් ද එය අනාත්ම යි, යමක් අනාත්ම ද, එය මම මගේ, මගේ ආත්මය ලෙස ගත නොහැකිය, මෙසේ සම්‍යක් ප්‍රඥාවෙන් දැක යුතුයි. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ අනිත්‍යයයි ලෙසද, අනිත්‍ය නම් එය දුක ලෙස ද, යමක් දුක නම් එය අනාත්ම ලෙසද යමක් අනාත්ම ද, එය මම මගේ, මගේ ආත්මය ලෙස ඇති සැටි සම්‍යක් ප්‍රඥාවෙන් ගත නොහැකි බව ඇති සැටි සම්‍යක් ප්‍රඥාවෙන් දැක යුතුය.

එතකොට අපි මේ කතා කරන්නේ අරහත්ත සූත්‍රය. ඒ කියන්නේ රහ නැති, වෙන තැන අරහත්තයි. ඒ අරහත්ත කියන්නේ, රහ නැති වෙන එකටයි. අරහත්ත කියන්නේ, කෙනෙක් පුද්ගලයෙකු

නොවේ. අරහත්වය කියන්නේ මේ සියල්ලේම තෘෂ්ණාව, තණ්හාව ක්ෂය වෙන තැන. ඒ අරහත්වය රහ නැතිවන ස්වභාවයට පත්වීමයි, එතකොට මෙතනින් හොඳට ඔබට දකින්න ලැබෙනවා. මේ පැහැදිලි කළ කාරණාව. මහණෙනි, රූපය අනිත්‍යය "රූපං භික්ඛවෙ, අනිච්චං යදනිච්චං තං දුක්ඛං," එය අනිත්‍ය නම් එය දුකයි යං දුක්ඛං, තදනත්තං. එහෙම නම් ඒක අනාත්ම යි "යදනත්තා තං, නෙතං මම, නෙසො හමස්මිං, න මෙසෝ අත්තාතිං" අපි කිව්වා අපිට මේ පේන දේ දකින දේ එය සත්‍යයක් නොවන බව. අපි මේ හදාගත්ත දෙයක්. දකින බව පේන්නේ අපිට අඹ ගහක් නෙමේ පේන්නේ චිත්‍රයක්. කණ්ණාඩියට වැටෙන්නේ ප්‍රතිබිම්භයක්. ඒ තුළ නැහැ දෙයක්. මේසය, පොත්, ඇඳ, දුව මේවා ශබ්ද. අර වර්ණයි ශබ්දයි එකට එකතු වෙන එක. වර්ණය, ශබ්දය - දිට්ඨ, සුත, මුත වර්ණ ශබ්ද සහ දැනීම් එකට සම්පටිච්ච වන එක. අන්න ඒ නිසා අපට දැන් එක දෙයක් වෙන්වෙන්නේ නැහැ.

මේකෙ තියනව ශබ්ද වර්ණ දැනිම් ටික. අපි මේවා, අපි කීවා මහා භූත නිසා සකස් වුණු ඒ උපාදාය රූපය. ඒක සකස් වුණේ කොහොමද? ස්පාර්ක් වීම තුළ, ප්‍රසාදවත් වීම් තුළ, දැන් කියන වචනය අපි නූතන වචනය ස්පාර්ක්. බුදුන් වහන්සේ පෙන්නුවා මේ ප්‍රසාද වත් වීම ප්‍රසාද රූපයක්, රූප කලාප පණස් සතරෙන් හැදෙන්නේ ප්‍රසාද රූපයක් අපි ඒක පෙන්නුවා කම්ම චිත්ත ඍතු ආහාර කියලා දශක දශක විදියට බෙදලා. බුදුන් වහන්සේ පෙන්නුවා රූප කලාපය පනස් හතරක්. ශුද්ධාෂ්ඨකය ඔබ දන්නවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා කියලා මේ විදියේ රූප කලාප 54 කින් ප්‍රසාද රූපයක් හැදෙන්නේ. ඒ කියන්නේ ප්‍රතිබිම්බයක් බාහිර තියන එකක් නෙමෙයි. ඒක මහා භූත ඇසුරු කරගෙන හැදුනු උපාදාය රූපයක්, ඒ කියන්නේ හදාගත්ත එකක් සංකතයක් සකස් කර ගත්ත එකක් සංඛාරයක්, සංඛාරයක් කොහේවත් නැහැ, ඒක චිත්තයක්, මේ අපි ඇසුරු කරන්නේ සිතුවිල්ලක්.

අඹ ගහ කිව්වේ නැහැ, අඹ ගහ කියලා. අපි කියන්නේ අඹ ගහ කියලා. එහෙම නම් ඒක බාහිර තියෙන රූපය නෙමේ 'නතේ කාමායානි චිත්‍රානි ලෝකෝ සංකප්ප රාගෝ පුරිසස්ස කාමෝ ඒ පුරුෂයගේ සංඛාර, සංකප්ප ලෝකේ ඉන්නේ චිත්තේන නීයති ලෝකෙ ඉන්නේ, මනෝ පුබ්බංග මා' මේ ධර්මය, එහෙනම් මෙන්න මෙතනයි චක්ඛුං නිච්ච වෝ අනිච්චතෝ අනිච්චං භන්තේ කියන්නේ ඔබ බාහිර ඇත්ත කරගෙන නං ඔබ බෞද්ධයෙක් නොවේ. බෞද්ධයෙක් කියන්නේ බාහිර ඇත්තක් නොවන බව දකින තැනයි. අජ්ඣත්ත බහිද්ධා කියලා අන්ත දෙකක් පෙන්නලා ඒ දෙකටම අයිති නැති ධර්මයක් දේශනා කළා. බුදුන් වහන්සේ ඇත කිව්වත් වැරදියි මහණෙනි, නැත කිව්වත් වැරදියි මහණෙනි, තියෙන දෙයක් නැහැ මහණෙනි, තියන ලෝකයක් නැහැ මහණෙනි, අන්න බුදුන් වහන්සේ, හේතුන් පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ජතී කියන ඒ හේතු ඵල දහම දේශනය කළා. යේ ධම්මා හේතු භගවා තේසං හේතු තථාගතෝ ඒ අස්සජි මහරහතන් වහන්සේ අන්න පැවසුවා.

ඒ තථාගතයන් වහන්සේ හේතුඵල දහමක් දේශනා කරනවා ධම්මචක්කපවත්වන සූත්‍රයේ පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු වූ කියලා පෙර නොඇසූ විරූ දහමක් ලෙසින් බුදුන් වහන්සේ දේශනා කරන්නේ අජ්ඣත්ත බහිද්ධා කියලා අන්ත දෙකක් පෙන්නලා ඒ අන්ත දෙකට ම අයිති නැති ධර්මයක් එහෙනම් බාහිර තියන දේ සත්‍යයක් ද?, නෑ

"චක්ඛුං නිච්ච තෝ අනිච්චතෝ" "අනිච්චං භන්තේ" "රූපං නිච්ච තෝ අනිච්චතෝ," "අනිච්චං භන්තේ." ඇස අනිත්‍ය නම් මහණෙනි, ඇස කියන්නෙ පේන බවට, මස් ඇහැට නෙමෙයි. පේන බව නම්, අපට උපමාවක් ලෙසට ගත්තොත් මේ පොත, පොතක් බාහිරින් හමුවෙනවද? පොතක් බාහිරින් හමු වෙනවා නම් පොත බාහිර ඇත්ත කර ගත්ත කෙනෙක්ට මේ ධර්මය හමුවෙන්නේ නැහැ. අන්න, අපි හිතන ධර්මයක්. පොත කියන්නේ ශබ්දයක්. ශබ්දයයි වර්ණයයි එකතු වෙලා හැදෙන ශබ්ද තරංගයි, වර්ණ තරංගයි එකතුවෙලා හැදෙන චිත්ත තරංගයක් අපි ඇසුරු කරන්නේ.

විඤ්ඤාණ මායාව, අර සංඛාර එකතු කරලා හදාගත්ත. අපට දැන් පේන කොටම එනවා ශබ්දය, ඒකයි නාමරූප. අපි හදාගත්ත එකක්. බාහිර කියලා ගත්ත එකයි අජ්ඣත්ත බහිද්ධා කියන එක, බාහිරට ගැටගහලා. අපි දැන් තියනවා කියලා හිතීම, ඒ දැනිමයි, අර වේගයෙන් රූප ස්පාර්ක් වෙන එක. වේගයෙන් රුප්පනය වෙන එක. රුප්පත්ති කෝ ආවුසෝ රූපං කියපු එක. වේගයෙන් රුප්පනය වීම තුළ අපට දෙයක් හමු වෙනවා. රුප්පතිකෝ ආවුසෝ රූපං වදෙති රූපං රූපත්තාය සංඛතං අභිසංකාරෝති කියපු ආකාරයට අපිට අද රූපයක් පේනවා දෙයක් පේනවා දෙයක් කියලා දෙයක් නෑ කොහේවත් නැහැ. ඒකයි සංඛාරය, ඒකයි විඤ්ඤාණ මායාව ඒක දකින කෙනා අන්න සෝතාපන්න මාර්ගයට එනවා.

බාහිරයෙන් දෙයක් නැති බව දකිනවා, ඒක සිතුවිල්ලක් බව දකිනවා, චිත්තයක් බව දකිනවා, එහෙම දෙයක් බාහිරෙන් හමුවන්නේ නැහැ. මේ

සත්‍යය දකින එක පහසු නැහැ. පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු කියලා පෙර නො ඇසූ විරූ දහමක් ලෙසින් බුදුන් වහන්සේ ලෝකයට හෙළි කරන ධර්මයයි. මේ එයයි බුද්ධ දර්ශනය. එයයි බාහිර ඇත්ත කරගත්ත තැන බෞද්ධයෙක් නෑ කීවෙ. සතා සිවුපාවා පවා ඉන්නේ බාහිරය ඇත්ත කරගත්ත තැන සියලු ආගම් තියෙන්නේ බාහිර ඇත්ත කරගත්ත තැන. නමුත් බුදුන් වහන්සේ ලෝකයට හෙළි කරන ඒ ධර්මය නම්, ඇත කිව්වත් වැරදියි, නැත කිව්වත් වැරදියි, තියෙන ලෝකයක් නෑ මහණෙනි, හේතුං පටිච්ච සම්භූතං හේතු නිරුජ්ජන් නිරුජ්ජන්ති අන්න හේතුඵල දහමක් දේශනා කරනවා සම්භූත වෙන කියන වචනයත් ලෝකයට හෙළිකරනවා.

බුදුන් වහන්සේ, තියෙන දෙයක් නෙමේ සම්භූත වෙනවා කියන්නේ සංඛතයක්. සකස් වෙන දෙයක්, චිත්තයක්, සිතුවිල්ලක්. අපි දකින්නේ අපි හීනෙනුත් සිතුවිලි දකිනවා. බුදු අම්මෝ කියලා කෑ ගහන්නේ හීනෙන් කාගෙ ත් හරි ගුටි කෑවොත්. ඔබ, ඇයි ඔබ සැප දුක් විඳ නැද්ද හීනෙන්? ඒ කියන්නේ හිනෙනුත් සැප දුක් වින්දා. ඒකමයි ඇත්ත ලෝකෙත්, සිතුවිල්ලකින් මයි සැපදුක් විඳින්නේ. ඒකයි චිත්තේන නීයතී ලෝකේ කියලා කියන්නේ.

එහෙනම් මහණෙනි මේ කොටසින් ඔබට දකින්ට ලැබෙනවා රූපය අනිත්‍ය නම් එය දුකයි. බාහිරින් පේන දේ සත්‍යයක් නොවේ. එහෙනම් එතන දුකමයි හටගන්නේ, දුකමයි පවතින්නේ, දුකමයි නිරුද්ධ වෙන්නෙ. මොකද? නැති දෙයක් තියෙනවා කියලා හිතීම, නැති දෙයක් තියෙනවා කියලා ගැනීමයි දුකට හේතුව. අන්න සමුදය දෙයක් කියලා ගත්ත එක. අන්න, එතන මයි දුක හටගන්නේ. අන්න, ඒකෙ සත්‍යය දකින කෙනා, එහෙම දෙයක් නැති බව නිරෝධය අන්න නිරෝධයට පත් වෙනවා. අන්න ඒකෙන් මිදෙනවා. සිතුවිල්ලෙන් මිදෙනවා අන්න එතනයි දුකෙන් මිදෙන තැන. අන්න, ඒ දැකීමයි, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය අන්න චතුරාර්ය සත්‍යය.

සමුදය බාහිර දෙයක් කියලා ගැනීම එතැනමයි දුක්ඛ සත්‍යය, තණ්හාව ජාති ජරා මරණ ශෝක පරිදේව සියල්ලේම බාහිර දෙයක් තිබ්බොත් ඒකටයි ඇලෙන්නේ ගැටෙන්නෙ රාග ද්වේශ මෝහ සිත් හටගන්නේ, එතැනමයි දුක එතැනමයි උපාදාන, එතනමයි ජාති ජරා මරණ, එතැනමයි භවය, බාහිර දෙයක් තියෙනව නම් එතැන භවය තියනවා ජාතිය තියෙනවා උපත මරණ දෙකම එතනම දෙයක් කරගත්ත තැනයි දුක තියෙන්නෙ. එහෙනම් දුකින් මිදෙන්න සත්‍ය දකින තැනයි එහෙනම් දුකින් මිදෙන්න සත්‍ය දකින්නේ එතනයි. බාහිර දෙයක් නැති බව දකින තැන පිරිසිදු ශ්‍රී සද්ධර්මය ඔබට මුණ ගැහිලා තියෙනවා.

දැන් මේ ධර්මය සූත්‍රවල ඔබට දකින්න ලැබෙනවා අපි මනා කොට ඒවා හෙළි කරගෙන යන්නේ. ඒ ඔබ දකින්නේ ධර්මයයි එහෙනම් 'රූපං භික්ඛවේ අනිච්චං, යදනිච්චං තං දුක්ඛං. රූපය අනිත්‍ය නම් මහණෙනි එය දුකයි. රූපය කියන්නේ එන අරමුණේ ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප. එහෙනම් රූපය කියලා ගන්නේ, බාහිර දෙයක් කියලා ගත්ත තැනමයි, අරමුණ කියන්නේ. එහෙනම් බාහිර දෙයක් නැති බව දකින තැනමයි, රූපය අනිච්චං කියන්නේ. අනිත්‍යය දකිනවා කියන්නෙ, බාහිර දෙයක් නැති බව දකින තැනයි. දෙයක් තියෙනවානන් ඒ රූපය ඇත්ත කරගත්ත තැනයි.

එහෙනම් 'විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සං කායේ කායානුපස්සී විහරති' කියන විදියට ලෝකය ඇත්තක් නොවන බව දකින්නයි සතර සතිපට්ඨානය වඩන්නේ. එහෙනම් ලෝකය ඇත්තක් නෙවෙයි, අපි හදාගත්ත දෙයක් දකින්නේ. ඒකයි පේනවා නෙමෙයි හිතනවා කියලා කියන්නේ. එහෙනම් චිත්තයක් අපි ඇසුරු කරන්නේ. රූපං භික්ඛවේ අනිච්චං යදනිච්චං තං දුක්ඛං; අනිත්‍ය නම් එය ඇත්තක් නෙමෙ නම් මහණෙනි එය දුකයි. එහෙනම් මහණෙනි දුක නම් එය තද නත්තං ආත්ම වශයෙන් ගත හැකිද? මෙතන ආත්ම කතාවක් නැහැ. අනාත්ම ධර්මය ලෝකයට හෙළි කරනවා. හේතුන් පටිච්ච සම්භූතා හේතු නිරුජ්ජන් නිරුජ්ජති කියන්නේ ආලෝකය තියන විට පේනවා. ආලෝකය නැත්නම් පේන්නෙ නැහැ. එහෙනම් මේ පේනවා කියන එක කවුරුත් කරනවා නෙවෙයි. හේතුව තියෙනකොට තියෙනවා නැති වෙනකොට නැති වෙනවා. සොබාදහමක්. දෙයක් කියලා දෙයක්, නැති බවයි. ඉදන් පච්චි තාවය, මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ. මේ හටගත් කල්හි මෙය හට ගනී. මේ අය නිරුද්ධ වන කල්හි මෙය නිරුද්ධ වේ. අන්න, ඉදං පච්චයතාවය කියන්නේ දෙයක් නැති බවයි, පොත, මේසේ, ඇඳ, දුව, පුතා, ඉර, හඳ, ගහකොළ දෙයක් කියලා ගත්ත තැන දුකයි තියෙන්නේ. දෙයක් නැති බව දකින තැනය් පටිච්ච සමුප්පාදය මෙනෙහි කරනවා කියන්නේ. හටගන්නා ආකාරය සිහි කරන එකයි. අවිද්‍යාව නොදන්නාකම සංඛාරා එකතු කරගත්ත නාමරූප. අන්න එකතු වුණ තැනයි සංඛාර එකතු වුණ එකයි, ඒකමයි විඤ්ඤාණය කියන්නේ. ඒකමයි ආයතන කියන්නේ ඇස කියන්නෙ පේන බව කියන්නේ මේ මොහොතේ සිතට එන

අරමුණයි මේ සියල්ලම අරමුණයි සිත කියන්නේ එහෙනම් අරමුණුයි, මේ සියල්ලම. එහෙනම් ඵස්ස පච්චයා වේදනා, තණ්හා, උපාදාන, ඵස්ස පච්චයා වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ කියන ස්කන්ධයෙන් තමයි පොතක් හදා ගත්තේ ඒකමයි සංඛාර කරනවා කියන්නේ ඒකමයි අපි අවසානයේ මේ එන අරමුනයි මේ සේරම. දැනගැනීම විඥානය වෙන්නේ. අන්න චක්ඛු ප්‍රසාදය තුළ සෝත ප්‍රසාදය තුළ අර අවසානයේ මේ සියල්ල එකතු වෙලා හදාගත්ත අන්න මනෝ විඤ්ඤාණය කියන එක හදාගත්තා දැන ගැනීමයි පොත කියන එක වට්ටං වට්ටති වට දෙකක් කැරකිලා එන කිරණ නෙමේ අපි දකින්නේ පින්තූරයක් නෙමේ අපි දකින්නේ පොතක් කියලා හදාගත්ත දෙයක් වට්ටං වට්ටති වට දෙකක් කැරකෙන තැන. ඒ ඵස්ස ඒ චක්ඛු විඤ්ඤාණය තිණ්ණං සංගති ඵස්සෝ කියන තැනින් වේදනා, සංඥා, සංඛාර ඔස්සේ ආයෙමත් හටගන්නවා ස්පර්ශයක්. ඒකයි වේදනා සංඥා චේතනා පස්ස මනසිකාරය කියල කිව්වෙ.

අපි දෙයක් කියලා ගත්තොත් ඒක තමා මනසිකාරය යං වේදේති තං සංජානාති යං සංජානාති තං විතක්කේති යං විතක්කේති තං විජානාති යං විජානාති තං ප්‍රපංචේති අන්න අපි බාහිරය ඇත්ත කරගත්තොත් රැවටුනොත් විජානාති. යංවේදේති යමක්ද ඒ වින්දේ? යං වේදේති තං සංජානාති තං විතක්කේති යං විතක්කෙති තං ප්‍රපංචෙති, එහෙම වුණොත් තමයි ආ ඒ පොත ලස්සනයි කැතයි හොඳයි නරකයි කියලා කතා ගොඩක් හදාගෙන උපාදාන කරගෙන අන්න වේදනා පච්චයා තණ්හා උපාදාන භව ජාති ජරා මරණ ශෝක පරිදේව සියල්ලම තියන්නේ දෙයක් කියලා ගත්ත තැනයි මේ සිතට එන අරමුණෙයි, පටිච්ච සමුප්පාදය තියන්නේ. මේ සිතට එන අරමුණෙයි චතුරාර්ය සත්‍යය තියන්නේ. මේ සිතට එන අරමුණුයි සත්තිස් බෝධිපාක්ෂික ධර්මයම වඩන්න තියෙන්නේ. ඒකයි ක්ෂණ සම්පත්තිය කියල කිව්වේ. මේ ක්ෂණය විතරයි. ක්ෂණය කියන්නේ හටගෙන නිරුද්ධ වන එක් ක්ෂණික සිතක, උදය වැය, සම්මතය තුළ මරණය හමු නොවේ කියලා කිව්වේ, එවිට මර බියක් නැහැ. මරණයක් නැහැ. සියල්ලෙන් මිදෙන තැන. මේ සියල්ලම එකම තැනයි. අපි ඒකයි, ක්ෂණ සම්පත්තිය, බුද්ධක්ෂණය කියලා කියන්නේ, ඒ සිතිවිලි වලින් මිදෙන තැනම, අවදි වන්නේ බුද්ධ ස්වභාවයටයි ඒක මේ සූත්‍රය තුළින් ඉතින් ඔබට දකින්නට ලැබෙනවා ඒක වටිනාම තැනක්. ඇත්තටම ඔබ දැකිය යුතුමයි,

දැන් එතකොට ඔබට දකින්න ලැබෙනවා යමක් අනාත්ම ද? එය මම, මගේ, මගේ ආත්මය වශයෙන් ගත හැකි ද? නො හේතං භන්තේ. අන්න නේතං මම නේසෝ හමස්මි නමේසෝ අත්තාති, ඒව මේතං යථාභූතං සම්පඤ්ඤං දට්ඨබ්බං, එතකොට එය ඇති සැටියෙන් සම්‍යක් ප්‍රඥාවෙන් දැකිය යුතුය, මහණෙනි මෙසේ දක්නා ශ්‍රතවත් ආර්ය ශ්‍රාවකයා රූපයෙද, කලකිරේ වේදනාවේද, කලකිරේ. සඤ්ඤාවේද කලකිරේ. සංඛාරයේද කලකිරේ. විඤ්ඤාණයේද කලකිරේ. කලකිරුනේද නොඇලේ. නොඇලුනේද මිදේ. මිදුණේද, මිදුණු කල්හි, විමුක්ති ඥාණය යැයි කියනු ලැබේ. ජාතිය ක්ෂය විය බඹසර වැස නිමවන ලදී කරණිය කරන ලදී මෙන්න මෙයයි මහණෙනි සම්පූර්ණයෙන්ම මෙතැන මේ සියල්ල පෙන්වනවා.

එතකොට අපි මේක සූත්‍රයෙන් බලමු. ඒවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බිදන්ති, වේදනායපි නිබ්බිදන්ති, සඤ්ඤායම්පි නිබ්බිදන්ති නිබ්බන්දං විරජ්ජති. විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායා'ති පජානාති, අන්න වෙන කළ යුත්තක් නැති බව මේ වාක්‍ය තුළම ගැබ්වෙනවා. ඛීණා ජාතිය ක්ෂය විය, බඹසර වැස නිමවන ලදී, කරණීය කරන ලදී, මේකේ මෙතන තේරුම ඇත්තටම මෙතන තියෙනවා, අරහත්වය කියලා දෙයක් නැහැ. රහ නැති වෙන තැන එයයි. නමුත් මෙතැන තේරුමේ ලියනව "අරහත්වය" අන් කිසිවක් නැත යයි දනිමි, කියලා ඒ කියන්නේ, අරහත්වය කියලා දෙයක් මෙතන පැහැදිලි කරන්න වචනෙන් ලිව්වට මේ සූත්‍රය තුළ එහෙම දෙයක් එතැන නැහැ එතන තියෙන්නේ ඒවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බිදන්ති වෙදනයපි නිබ්බිදන්ති, නිබ්බිදන්ති සංඛාරෙසුපි නිබ්බිදන්ති විඤ්ඤාණස්මිම්පි නිබ්බිදන්ති නිබ්බින්දං විරාජ්ජති. විරාගා විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛිණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණියං නාපරං ඉත්ථත්තා'ති පජානාති කියලා නමුත් තේරුමේ ලියලා තියෙනවා අරහත්වය කියලා දෙයක්, කරලා එහෙම දෙයක් මේකේ සඳහන් වෙලා නෑ සූත්‍රයෙ. ඒ ලියල තියනවා මේ අරහත්වය පිණිස අන් කිසිවක් නැතැ යි දනී කියලා ඇත්තටම අරහත්වය කියලා දෙයක් මෙතන පෙන්නන්න හැමතිස්සෙම උලුප්පන්න, ගියාට මේ අරහත්ත සූත්‍රය රහ නැති වෙන තැන, අපි ඊ ගාව කොටසට එනකොට ඔබට මේක තවත් හොඳට වැටහෙයි.

මතු සම්බන්ධයි.

පසුගිය කලාපයෙන් ..........

# අවිද්‍යා ලොවම දෙදරවමින් පැතිරුණ සත්‍යයේ මහා දෝංකාරය




ආර්යයන් වහන්සේ : හරි. අපි දැන් පොත් ගොඩක් කියවල පැත්තකින් දාල තියෙන්නෙ. පොත් කියවල තියෙනව අපි මේ එකතුකරල තියන පොත් දිහා බැලුවොත් එහෙම කාට හරි ලයිබ්‍රියක් දැමිය හැකි. කියෙව්වොත් එහෙම මිනිස්සු ඔළුව අවුල් කරගන්නව. ඒක නිසා අච්චු ගැහුවෙ නෑ. රේරුකානේ චන්දවිමල හාමුදුරුවොත් අන්තිමට කියනව මේ පොත් ගිනි තියල දාන්න ඕන කියල. ඒකට හේතුව මේ අවබෝධ කරගන්න කොට, නුවණ විමසන කොට පොත් ටික ලියවෙනව. හැබැයි ලිව්වට පස්සේ අවබෝධ කරන දේ බලනකොට පොත්වල තියන ඒව ඔක්කොම බොරු වෙනව. ඔක්කොම බොරු කියල අවබෝධ වෙනව. අන්තිමට පොතේ ලියපුව බොරු වෙනව කියල අන්තිමට අවබෝධ වෙනව. ඊට පස්සෙ ඒව කරේ තියාගත්තොත් කවුරු හරි මොකද වෙන්නෙ ඔක්කොගෙම නිවන ඉවරයි. හැබැයි ඒ ටිකම තමයි කියන්නත් ඕන. ඒකට හේතුව තමයි නොදන්නකම. ඒ ටික කියවනකොට කියවනකොට තමයි තේරෙන්නෙ මේක පොතේ තියෙන එකක් නෙවෙයි. හැබැයි මුලින් මේ වචන ටික පොතෙන් අල්ලගන්න අපිට හැකියාව තියනව. හැබැයි ඒක ගලපගන්න පසල් එක කියල අපි කියන්නෙ මේකයි. පසල් එක වගේ තියෙන්නෙ. ඔක්කොම අවුල්වෙලා තියෙන්නෙ. වචන ටික ඒව මේව අවුල් වෙලා තියෙන්නෙ. දැන් පසල් එක හදන්නෙ කවුද? අපි මේක හදාගන්න ඕන.

උපාසිකාව : අපිම මේක හදාගන්න ඕන.

ආර්යයන් වහන්සේ : අපිම හදාගන්න ඕන. ඉතිං මේක අවිද්‍යාව. මේ තනිකරම ඇවිල්ල සම්පූර්ණයෙන්ම අපිගාව තියෙන්නේ අවිද්‍යාව. දැන් ඔබතුමිය ඔය කියපු හැම දේටම උත්තරේ කියන්න පුළුවන් එතනින්. ඒ කියන්නෙ දෙයක් නැත්නම්, දැන් ඔබතුමිය බලන්න හැම එහෙකටම උත්තරේ එන්නැද්ද කියල. නුවණින් මෙනෙහි කරල බලන්න. දැන් අපි හැම තිස්සෙම ප්‍රශ්නෙකට කාගෙන් හරි අපි බලාපොරොත්තු වෙන්නෙ අපි ඉගෙන ගන්න රටාවට මේ කොහේ හරි උත්තරයක් කවුරු හරි කියයි. එහෙම නැත්නම් පොතක තියෙයි. ඔන්න ඔහොම තමයි අපි හිතන්නෙ, ඒ සිස්ටම් එක වැරදියි.

උපාසිකාව : දැන් මට තේරෙනව ආර්යයන් වහන්ස.

ආර්යයන් වහන්සේ : අභ්‍යන්තරයෙන් ම අපි විසින් නුවණින් මෙනෙහි කරල හදාගන්න ඕන පිළිතුර. අපි එහෙම රටාවකට යන්න ඕන. එහෙමයි බුද්ධිගෝචර, ප්‍රඥාගෝචර ඒකයි නුවණ. ඇත්තටම අපිට උපතින් මොකුත් නැහැනෙ. අපි මේ නුවණ පාදගන්න එපෑ. ඉතින් ඔබතුමිය අභ්‍යන්තරයෙන්ම ප්‍රාඥයෙක් වෙන්න ඕන. මේක ප්‍රඥාවන්තයින්ගෙ දහමක්. ප්‍රඥාවන්තයා කියන්නෙ කාගෙන්වත් එහෙම උත්තර ගන්න එකක්

නෙමේ. තමා විසින් නුවණින් අවබෝධ කරගන්න එකක්. අවබෝධඥාණයක් සංඛිත්තෙ නිබ්බිදාය කියන අවබෝධඥාණයක් කවදාවත් ම කාටවත් කියල කරන්න බෑ. බුදුන් වහන්සේ එහෙනම් නිවන් දක්කනව. බුදුන් වහන්සේට එහෙම නිවන් දක්කන්න බැහැ. තමන් අවබෝධ කරන්නම ඕන. ඒ කියන්නෙ තමන් මේක නුවණින් විමසන්නම ඕන.

උපාසිකාව : එහෙමයි.

ආර්යයන් වහන්සේ : ඒ කියන්නෙ අභ්‍යන්තරයෙන් හැම එකම ගලපන්න ඕන. හැමඑකම තමන්ට ගලපන නුවණක් තියෙන්න ඕන. හැම එකම මෙනෙහි කරන කුතුහලයක් තියෙන්න ඕන. ඒක තමයි විදර්ශනාව. විදසුන් නුවණ. විදගෙන යන්න ඕන. ගල් කැටයක් දැක්කත් ගල්කැටය කුඩු කරල බිලාස් කරල, නැති කරල, ආයි ගල් කැටයක් හම්බවෙන්නෙ නෑ. ඒක අපි සමහර වෙලාවට පෙන්නනවා. මේ භෞතික පැත්ත සම්පූර්ණයෙන්ම කතා කරගෙන යනව. කතා කරල කතා කරල විශ්වය ගැනත් කතා කරල පෘථිවිය ගැනත් කතා කරල හැදෙන හැටිත් කතා කරල ඔක්කොම කියල අන්තිමට ම සේරම කුඩුවෙලා ගිහිල්ලා පෙන්නනවා මොකුත් නෑ කියල. භෞතික පැත්ත මොකුත් නෑ කියල අන්තිමට ම පෙන්නනවා. හැබැයි මේ හරි ලේසි ක්‍රමයක් බුදුන් වහන්සෙ කියනව. ඒකට හේතුව තමයි හිත හැදිල තියෙන්නෙ ඒ න්‍යාය ඇතුලෙ. අර එක කොලයක් දිහා බලනව වගේ තමයි එක සිතක් ඇතුලේ මේ ඔක්කොම කතාව තියෙන්නෙ. දැන් අපි පැහැදිලි කරවනෙ ඒ කියන්නෙ ඔය ඔක්කොම හිත්. බාහිර ගත්තත් අපිට අභ්‍යවකාසෙට ගිහිල්ලතමයි නවතින්නෙ. ගල් කැටයක් හරි අතට ගත්තොත්, ගල් කැටේ අතට ගත්ත කියන්නකො. ගල් කැටේ අතට ගත්තොත් මේ ගල් කැටේ කොහෙන්ද ආවේ. පෘථිවියේ තිබ්බද? කොහොමද පෘථිවියේ හැදුනෙ. ඊට පස්සේ මේ ගල් කැටේට ආයිත් මොකක්ද වෙන්නෙ. මේකත් ආයෙ කුඩුවෙලා ගිහිල්ල අභ්‍යවකාසෙම වෙලා තමයි නවතින්නෙ.

උපාසිකාව : දූවිලි වෙලා.

ආර්යයන් වහන්සේ : දූවිලි ඉතුරු වෙන්නෙත් නෑ. අපි කියනව මොකක්වත්ම ඉතුරු වෙන්නෙ නෑ. අපි ගල්කැටේ දිහා බලා ඉන්න කොට අභ්‍යවකාසෙ පෙනෙන්නෙ, පුදුම හිතෙනව. අපි එකපාරක් ඔන්න කොස් ගහක් දිහා බලා ඉන්නව. මේ ඇත්තම කියන්නෙ. එතකොට කොස්ගහ කැලි කැලි කැපුව. ඊට පස්සෙ ගිනි තිබ්බ. ඊට පස්සෙ දුමක් වගේ නැතිවෙලා ගියා. කොස් ගහක් කියල එකක් නැනෙ. දැන් මේක පැත්තකින් තියමුකො. ඊට පස්සේ පෘථිවිය ගන්න. පෘථිවියත් ඊට පස්සෙ බැලුව ඒකත් නැතිවෙලා යනව. අන්තිමට මොකක්වත් නෑ. දැන් ඇස් දෙක පියාගෙන මේක මෙනෙහි කරන කොට කොහොමත් අභ්‍යවකාසෙමයි පේන්නෙ ඊට පස්සෙ. දැන් එළියකුත් තියනව කියල දැනෙන්නෙත් නෑ. ඊට පස්සෙ දැන් ඇත්තටම මේක ධර්මය දිහා බලනකොට තේරෙනව අපි මේ හිතන එකනෙ. හිතනවනේ මේ ඔක්කොම.

උපාසිකාව : එහෙමයි. ඒකම තමයි ආර්යයන් වහන්ස.

ආර්යයන් වහන්සේ : හිතනව. පෘථිවිය කියලත් හිතනවා. අභ්‍යවකාසය කියලත් හිතනව, ගහ කියලත් හිතනව. දරුවො කියලත් හිතනව, හිතනවනේ... හිතනවනේ.. මේ ඔක්කොම. එතකොට හොඳටම තේරෙනවනෙ දැන් බාහිර කතාවක් කොහොමත් නෑ. දැන් ඒ කතාව කුඩුවෙලානෙ. දැන් හිතන කතාවනෙ තියෙන්නෙ.

උපාසිකාව : මේක තියෙන්නෙ ඔළුව ඇතුලේ. මේක සිතුවිල්ලක් විතරයි.

ආර්යයන් වහන්සේ : සිතුවිල්ලක් විතරක් නෙවෙයි. ඔය හිතන දේවල් ඔක්කොම බොරුවක්නෙ.

උපාසිකාව : ආ... ඒක එළියෙ නැත්නම් ඒක සිතුවිල්ලක් විතරයි.

ආර්යයන් වහන්සේ : එළියෙ කතාවක් නෙවෙයි. එළියෙ කොහොමත් මොකුත් නෑ. ඒ ගැන කොහොමත් කතාවක් නැනෙ. ඔය ඒකයි මෙතන ධාතු මස්තකේ හරියට වැඩුවොත් ඒ ධාතු මනසිකාරය තුළත් මොකුත් හම්බවෙන්නෙ නෑ. ඇත්තට ම බැලුවොත් මේක, ස්කන්ධ පැත්තෙන් බැලුවත් මොකුත් හම්බවෙන්නෙ නෑ. ඒකයි ඔය කායානුපස්සනා කොයිපැත්තෙන් බැලුවත් මොකුත් හම්බ වෙන්නෙ නෑ. මේක දැන් හිත පැත්තෙන් මේක බලන්න. දැන් ඔක්කොම සිතුවිල්ලක් කියල ගත්තොත් මේකෙ මේ සිතුවිල්ලක් කොහෙද තියෙන්නෙ. ඒව අභ්‍යාවකාසෙටම තමයි වැටෙන්නෙ. සිතුවිල්ලක් හම්බවෙන්නෙ නෑ. දැන් පොතක් කියන කතාවක් කොහෙවත් නෑ. පොතක් කියන්නෙ ශබ්දයක්.

උපාසිකාව : ශබ්දයක් සහ රූප මේකේ මැවෙනවනෙ. අපිට රූපයක් මැවෙනවනෙ එකපාරට

මතු සම්බන්ධයි.

# මෙත්මල් මෙහෙණි ආරාමය හොරණ

මෙය කුඩා නමුදු රමණීය ආරාමයක් බව පළමු ව සඳහන් කරමු. වර්ෂ 2021 දී ආරම්භ කළ මෙහි දැනට මෙහෙණින් වහන්සේලා දෙනමක් පමණක් වැඩ වසති.

2022 වර්ෂයේ බුද්ධෝත්පාදෝ ආරාමයක් ලෙස නම් කෙරිණි. අනතුරුව ආරාමය අවට ප්‍රදේශවාසී බොහෝ දෙනෙකුට විශාල සේවායක් ඉටු කරන ආරාමයක් බවට පත් විය. බුද්ධෝත්පාද ධර්ම දේශනා තුළින් ගිහිගෙන දැවෙන හදවත් නිවා සනසාලීම ආරම්භ කෙරිණි. එසේ ම බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේගේ මහා කරුණාව නිසා ආරම්භ කළා වූ වැඩසටහන් රැසකි.

- අසරණ පවුල්වලට පිහිටවීම
- අසරණ වැඩිහිටියන්ට පිහිටවීම
- දුප්පත් දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා පාසල් පොත් සහ උපකරණ ලබාදීම
- ගංවතුරෙන් පීඩා වට පත් වූවන් සඳහා වියළි ආහාර මලු බෙදා දීම

වැනි උතුම් ක්‍රියාවන් රැසක් මේ ව විට හොරණ ආරාමය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක වී තිබේ. එසේ ම නිවැරදි ශ්‍රී සද්ධර්මය නොලැබීම හේතුවෙන් නාමයෙන් පමණක් බෞද්ධයන් වී ආමිස පූජාවන්ට පමණක් ම මුල් තැන දෙමින්, දුකින් මිදෙන මග නොදැන දුකට ම පත්වන මග ට වැටෙමින් අසරණ ජීවිත ගෙවන බොහෝ වැඩිහිටියන්ට නිවැරදි ශ්‍රී සද්ධර්මය ඇසීමට සලස් වන දහම් කෙතක් බවට හොරණ මෙත්මල් අරණ ආරාමය මේ වනවිට පත් වී තිබේ.

බුද්ධෝත්පාදෝ ආර්යයන්වහන්සේ පෙන්වා දෙන්නා වූ ධර්ම මාර්ගයේ ම ගමන් කරමින් ආර්යයන්වහන්සේගේ සංකල්ප ක්‍රියාත්මක කරන මධ්‍යස්ථානයකි මෙය. බොහෝ දෙනාගේ හිතසුව පිණිස හැකි අයුරින්, ඉඳුම් හිටුම් සහ ආහාර පාන නොමිලේ සපයමින් දහම් මග ප්‍රායෝගික පුහුණුව ලබා දීම උදෙසා හොරණ මෙත්මල් මෙහෙණි ආරාමය කටයුතු කරන බව ද කිව යුතු ය.

ප්‍රදේශයේ හෝ ඉන් පිටතට ඕනෑ ම වයසක උපාසිකාවක් සඳහා කාරුණික භාවයෙන් යුතුව නිවැරදි නිවන් මග පහදා දී ප්‍රායෝගික පුහුණුව ලබාදීමට ගෞරවනීය මෙහෙණින් වහන්සේලා සැදී පැහැදී සිටින බව සඳහන් කිරීමට කැමැත්තෙමු.

අඩුපාඩු පැවතිය ද ඕනෑ ම තරාතිරමක, තැනැත්තියකට හොරණ මෙත්මල් මෙහෙණි ආරාමයට පැමිණ කාය විවේකයෙන් සහ චිත්ත විවේකයෙන් යුතුව මනා පුහුණුවක් ලබා නිවන් මගට පිවිස නිවනින් සැනසීම සඳහා පිහිට ලබා ගත හැකි ය.

තෙරුවන් සරණයි !

**කල්‍යාණ මිත්‍ර, මෙහෙණින් වහන්සේ**
**හොරණ**



# එක් දින ප්‍රතිපදාව

## පළමු පියවර
## සක්මන් භාවනාව

ප්‍රතිපදාවේ යෙදීම සඳහා සක්මන් භාවනාව ඉතා ම වැදගත් වේ. මෙහි දී පළමු ව සිතේ සන්සුන් භාවයක් ඇති කර ගත යුතු වේ. (එය භාවනාව සඳහා පමණක් නොව ඕනෑ ම කටයුත්තක දී සැලකිය යුතු කරුණකි.) කලබල වීම හෝ හදිස්සිය ඔබගේ අවධානයට සහ අවබෝධයට බාධා ගෙන දෙනු ඇති බව සලකන්න. කාය විවේකය චිත්ත විවේකයට හේතු වන බව ආර්යයන්වහන්සේ නිරන්තරයෙන් මනාව පැහැදිලි කර දෙන කරුණකි.

මේ පළමු කමටහනයි. මෙය ආර්යයන්වහන්සේ ඉදිරිපත් කරන්නේ බාහිර ඇත්තක් නොවන බව අපට පෙන්වා අවබෝධ කරවීමටයි.
ඇසට පෙනෙනවා. මනසට හසුවනවා.
(උදාහරණ:- ඇස දකින්නේ අඹ ගසක් බව මනස වටහා ගනී)

ප්‍රායෝගික වීමේ දී අපට පෙනෙන, ඇසෙන, දැනෙන සියල්ල ම සිතුවිලි බව අවබෝධ කර ගැනීමට අප සමත් විය යුතු යි. මෙහි දිගින් දිගට ප්‍රායෝගික වීමේ දී අප ඇසින්, කණින්, නාසය ආදී වූ ආයතනයන්ගෙන් ඇසුරු කරන්නේ සැබෑවක් නොව සිතුවිල්ලක් බව අවබෝධ වේ. මෙහි දී සරල ව කිවහොත් අප අත් දකින්නේ බාහිර නොව සිත ම බව අවබෝධ වේ.
එම නිසා සන්සුන් ව මේ අභ්‍යාසයේ යෙදීමට උත්සාහ කරන්න.

(මේ පිළිබඳ ඉදිරි කලාපවල දී වැඩි දුරටත් සකච්ඡා කෙරෙනු ඇත.)

## එක් දින පුහුණුව පැවැත්වෙන මෙත්මල් භික්ෂු අරණ, මෙත්මල් මෙහෙණි ආරාණ සහ මෙත්මල් විවේකාශ්‍රම පරිශ්‍රයන්

- ★ යාපහුව මෙත්මල් භික්ෂු අරණ
- ★ මාතර මෙත්මල් මෙහෙණි අරණ
- ★ රාජාංගනය මෙත්මල් මෙහෙණි අරණ
- ★ කඹුරුපිටිය මෙත්මල් මෙහෙණි අරණ
- ★ ගම්පහ මෙත්මල් මෙහෙණි අරණ
- ★ මතුගම මෙත්මල් මෙහෙණි අරණ
- ★ මහියංගනය මෙත්මල් මෙහෙණි අරණ
- ★ මිහින්තලය මෙත්මල් මෙහෙණි අරණ
- ★ පනන්ගල මෙත්මල් මෙහෙණි අරණ
- ★ පාදුක්ක මෙත්මල් මෙහෙණි අරණ
- ★ සූරියවැව මෙත්මල් මෙහෙණි අරණ
- ★ අම්බලන්තොට - රිදීගම මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ තිස්සමහාරාම - බෙරලිගල මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ අවිත්තාව - වලල්ලාවිට මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ මොරටුව - රාවතාවත්ත මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ කුරුණෑගල මෙත්මල් විවේකාශ්‍රමය
- ★ වැලිමඩ මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ කෑගල්ල මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ ගාල්ල මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ තණමල්විල මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ බලංගොඩ මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ මහනුවර මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ පානදුර මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ පිලියන්දල මෙත්මල් අරණ විවේකාශ්‍රමය
- ★ ගල්කිස්ස මෙත්මල් අරණ විවේකාශ්‍රමය

# ප්‍රතිපදාවේ අදියර හතර කෙටියෙන්



# බුද්ධෝත්පාදෝ zoom සාකච්ඡා



සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් දිනපතා පැවැත්වෙන සියලුම බුද්ධෝත්පාදෝ zoom සාකච්ඡා සඳහා Zoom link
https://zoom.us/j/91748075582?pwd=ZHlKQmwxOGNRUjJCVWtSSWkrNm50dz09



| | | | |
|---|---|---|---|
| 5:00 AM | උදෑසන | Buddothpado Practical Experience | https://yhttps://youtube.com/@BuddothpadoDPE outube.com/@BuddothpadoDPE |
| 7:45 AM | උදෑසන | Buddothpado English | https://youtube.com/@buddothpadoenglish |
| 9:30 AM | උදෑසන | Buddothpado Zoom Discussion | https://youtube.com/@Zoom-up2ik |
| 1:30 PM | දහවල් | Buddothpado Suthra Desana | https://youtube.com/@buddothpadosuththradesana |
| 4:00 PM | සවස | Buddothpado Practical Experience | https://youtube.com/@BuddothpadoDPE |
| 5.30 PM | සවස | Youth Dhamma Discussion | https://youtube.com/@BuddothpadoDPE |
| 7:00 PM | රාත්‍රී | ආන්දෝලනාත්මක දේශනා | https://youtube.com/@buddothpadodharma |
| 9:30 PM | රාත්‍රී | Buddothpado Zoom Discussion | https://youtube.com/@Zoom-up2ik |
| 12:30 AM | මධ්‍යම රාත්‍රී | Buddothpado Zoom Discussion | https://youtube.com/@Zoom-up2ik |

# දසත සිසාරා ඇසෙන බුද්ධෝත්පාදෝ දේශනා

**බුද්ධෝත්පාදෝ දේශනා ලක්හඬ රේඩියෝ නාලිකාව ඔස්සේ ගුවනට මුසුවන බවයි. සෑම ඉරිදා දිනකම රාත්‍රී 9:00 ට සවන් දිය හැක.**

**ලක්හඬ රේඩියෝ 93.5 - 93.7 MHz FM**




මේ බුද්ධෝත්පාද කාලයයි.

බුද්ධ ශාසනය නැවත පිබිදෙන යුගයයි.

සත්‍ය ධර්මය අවදි වී ඇති මෙවන් යුගයක ඔබටත් පුළුවන් නිවන් දකින්න

වසර 2500 කට පසු ගෞතම බුද්ධ ශාසනය නැවත අවදි විය.

කාලයේ වැලිතලාවට සැඟව ගිය ඒ බුද්ධ දර්ශනය නැවතත් ඔබට අසන්නට ලැබී ඇත.

**සවන් දෙන්න ?**
**බුද්ධෝත්පාදෝ දේශනා නිවන් දකින්න.**

## බුද්ධෝත්පාදෝ ආර්යන්වහන්සේ දමිළ ඔබ වෙනුවෙන්, ඔබගේ භාෂාවෙන්ම සත්‍ය ධර්මය ශ්‍රවණය කිරීමට සලස්වා ඇත




දමිළ ජනතාවටත් සැනසුම් සුවය ගෙන දෙන බුද්ධෝත්පාද දේශනා සෑම සිකුරාදා දිනකම ලංකාවේ වේලාවෙන් දහවල් 2.45ට ආරම්භ වන නවතම දෙමල Zoom සාකච්ඡා මාලාවක් 15.05.2025 වන දින සිට ක්‍රියාත්මක කිරීමට බුද්ධෝත්පාද ආර්යන්වහන්සේ විසින් සැලසුම් කර ඇත.
මෙම zoom සාකච්ඡාව පවත්වනු ලබන්නේ දමිළ භාෂාව හසුරවන ඔබ සඳහාම බව ඉතාමත් සතුටින් දන්වා සිටිමු. දමිළ ඔබට එදිනෙදා කටයුතු වලදී ඇතිවන අධ්‍යාත්මික ගැටලු නිරාකරණය කරගැනීමට අවශ්‍ය උපදෙස් මෙම සාකච්චාව තුලින් ඔබට ලබාගත හැක. සත්‍ය අවබෝධය තුලින් මානසික පීඩාවන් ගෙන් නිදහස් වූ සුන්දර සැහැල්ලු ජීවිතයකට මග පෙන්වීම මෙම දේශනා වලින් ඔබටත් අත් දැකියහැක.

ZOOM https://zoom.us/j/91748075582?pwd=ZHlKQmwxOGNRUjJCVWtSSWkrNm50dz09




බුද්ධෝත්පාදෝ දෙමළ Youtube නාලිකාව - https://www.youtube.com/@BuddothpadoTDD
https://youtube.com/@buddothpadotamil
මෙම නාලිකාව ඔස්සේ බුද්ධෝත්පාද දේශනාවල ඒ ධර්ම කරුණු දමිළ භාෂාවෙන් ඉදිරිපත් වේ.

බුද්ධෝත්පාදෝ WhatsApp group
Link
https://chat.whatsapp.com/GTvxy58EUxN2yqiJp5Yji9

---




PEO TV CHANNEL NUMBER 113

මෙම දේශනා Cable TV ඔස්සේ ඔබටත් සවන්දිය හැක.
විකාශනය වන නාලිකාව-PEO TV (113)
නාලිකාව - කර්ම TV
වේලාව : රාත්‍රී 8.00

### ආර්යයන් වහන්සේගේ, අප කෙරෙහි පහළ වූයේ මෙත් කරුණා ගුණය හේතු කරගෙන සත්‍ය බෙදා දීමේ අරමුණ ඇතිව මේ දුකින් මිදෙන සත්වයා, දුකින් මිදවා ගැනීමට ගන්නාවූ උත්සාහයේ තවත් ප්‍රතිඵලයක් හැටියට දුරබැහැර වෙසෙන අපගේ Youtube ශ්‍රවණය කිරීමටත් අපහසු අය වෙනුවෙන් TV බුද්ධෝත්පාද දේශනා ආරම්භ කොට ඇත.

මුලින්ම දේශනාවලට සවන් දෙන ආධුනික ශ්‍රාවක ශ්‍රාවිකාවන් සඳහා ඉතාමත් සුදුසුයි. මෙම දේශනා මාලාවෙන් බුද්ධ දර්ශනය, ප්‍රායෝගික ප්‍රතිපදාව, අභිඥා දේශනා සහ සූත්‍ර දේශනා විකාශනය වෙයි.
ප්‍රඥා ටීවී නාලිකාවේ ස්වාමීන් වහන්ස බුද්ධෝත්පාදෝ දේශනා කර්ම TV නාලිකාවේ විකාශනය කිරීමට එකඟතාව පිළිබඳව පළමුවෙන්ම අතිශයින්ම ගෞරව පූර්වකව ස්තුතිවන්ත වෙනවා. එම දේශනාවලින් ඇත්තෙන්ම ප්‍රතිඵලයක් ලබා ගන්නේ දුක් වීඩා විඳින අහිංසක ජනතාවයි. දුරබැහැර පළාත්වල වෙසෙන YouTube පාවිච්චි කිරීමට නොදන්නා සහ ස්මාට් ෆෝන් නැති අයටද මෙම ටීවී නාලිකාව ඔස්සේ බුද්ධෝත්පාද දේශනා ශ්‍රවණය කිරීමට අවස්ථාව ලැබේ.

මෙම දේශනා TV නාලිකාව ඔස්සේ විකාශනය කිරීමට ලංකාවේ මෙන්ම විදෙස්ගත ශ්‍රාවක ශ්‍රාවිකාවන්ද දායකත්වය දරා ඇත එම සියලුම දෙනාගේ සහයෝග අප ඉතා අගය කොට සලකනවා.

---

## දිනපතා පැය 24 පුරාවට ඇසෙන බුද්ධෝත්පාදෝ දේශනා

බුද්ධෝත්පාද ආර්යන්වහන්සේ දේශනාකළ සරල දේශනා මෙහිදී විකාශනය වේ.

නිස්සරන මග
නිවන ඔබ ළඟමයි.
සළායතන ලෝකය
සතර සතිපට්ඨානය
දර්ශන සමාපත්තිය
පරම සත්‍ය
ආර්ය දේශනා (පළමු කොටස)
සත්‍යයේ මහා සිංහනාදය
සිත කියලා දෙයක් නෑ
සතිය කියන්නෙ අපේ ගෙදර
පටිනිස්සග්ගානු පස්සනාව
ශූන්‍යතාවය සහ සොබාදහම දේශනා




බුද්ධෝත්පාදෝ රේඩියෝ නාලිකාව
මේ රේඩියෝ නාලිකා ඔස්සේ ඔබට සවන් දිය හැක.
Link – https://global.citrus3.com:2020/public/buddothpado

# Buddothpado English Zoom Discussion: A Global Gateway to the Liberation of Mind




**"The profound gift of the Dhamma surpasses all other gifts."**

More than 2,500 years after the passing (Parinibbāna) of the Lord Buddha, a rare and extraordinary timeless truth is once again awakened in our era. The path of Vidarshana—penetrative insight that pierces the veil of illusion—has brought the living Dhamma back into clear and radiant view. Through Dhamma Abhijñā— the expansive knowing that arises only when all sense of self dissolves irreversibly—Buddothpado Āryan Wahanse is unveiling the unshakable truth of liberation, accessible in this very moment.

**A Rare Opportunity**

The human birth is exceedingly rare—a precious opportunity to awaken to the timeless truth and break free from the cycle of birth and suffering. The Buddha never encouraged the continuation of cycle of birth (saṃsāra). His only guidance was to lead beings realize the Nibbāna/ Liberation of mind—the cessation of suffering within this very moment.

**What Makes Buddothpado Dhamma Teachings So Special?**

Unlike many modern teachings that aim to soothe the surface, the Dhamma sermons of Buddothpado Āryan Wahanse go straight to the root of suffering and the cessation of suffering through four noble truths (noble truth of suffering, noble truth of cause of suffering, noble truth of cessation of suffering, and noble truth of path to cessation of suffering). They are not mere philosophical discussions or intellectual ideas. These teachings reveal, through direct experience, how thoughts arise and cease, how perception is constructed, how the suffering arises and how the illusion of self can be seen through and dissolved in this very moment.

Rooted in the Five Aggregates (Pañcakkhandha) and the Four Insight Practices (Sathara Satipaṭṭhāna), these Dhamma revelations offer not only profound wisdom but a deeply practical path to liberation. Āryan Wahanse brings this ancient wisdom of how the sense of self is formed using relatable analogies from modern science, including quantum physics, string theory, and neuroscience. This makes the teachings especially accessible for modern seekers to explore and realize the Dhamma.

**A Path for All Seekers**

Whether you are a beginner, a seasoned Buddhist, or a curious truth-seeker, the Buddothpado Dhamma discussions offer a living path. These sessions are designed not just for listening but for direct realization. The invitation is to awaken here and now, in this very moment,

through clear seeing of true dhamma and direct experience.

**Buddothpado English Zoom Discussion**

To share this profound message with the world, Buddothpado Āryan Wahanse has initiated eight daily Zoom discussions, with one dedicated entirely to English-speaking seekers to spread this profound message globally. This English Zoom discussion is held daily at 7:45 AM (IST) Sri Lanka time and serves as a welcoming space for anyone interested in the timeless truth.
The platform is open to all who wish to ask deep questions, challenge assumptions, and explore the Dhamma with sincerity.

Furthermore, all English Zoom discussions are broadcast live on the Buddothpado English Zoom Discussions & Sermons YouTube channel (@BuddothpadoEnglish). All past sessions are publicly available on the channel to awaken truth seekers through the timeless truth.

**Begin Your Inner Journey**

If you feel drawn to the search for peace and liberation, you are most welcome. Simply scan the QR code on the image to join the Zoom session. You do not need prior knowledge or belief—just the honest intention to see.

**Awaken to the timeless truth within!**
**Prof. Kavinda**




# What is actual truth

We live in this world without knowing the reality of this world..Every moment thought becomes real for us.Why ?We did not know the creation of the world.When the thoughts are arising and they become real ,you are born there. Did you know when your thoughts become real then automatically you are born there?

No ,we did not know this mechanism .Thoughts are not real .It's just a spark or vibration .This vibration always gives us the wrong idea of self identity.But its a natural phenomena and no ownership for this series of sparks.

This natural phenomena is not easy to understand at once.

Our noble teacher Buddothpado Aryanwahansa has clearly explained us the "creation of our mind"

Without knowing the mind's creation we cannot escape from our thoughts or mind.

It is a fundamental thing in this true dhamma .
Aryanwahansa nicely explained it through "Radiant mind "

When you go back to your radiant mind we can understand how our thoughts create and make our world.

Thoughts are not real and minds are also not real.Its a complete illusion .This illusion leads us to the circle of birth.

Realisation of mind creation will help to eradicate the illusion of thoughts .Gradually the values that we assign to each thoughts and external world will diminish .But it happens according to our understanding .

It all depends on understanding and efforts to see the truth.

There is no existing world .All are an illusion .One day you can understand but it takes time. The most important factor is, it is a practical path and you can experience it in your day to day life.

There is no other teacher that explains this pure truth .Now we are fortunate to listen to this pure truth through Buddothpado sermons .

This is an experience beyond words and no other place in the world where you can see the pure truth except " Wisdom of Asia in Sri Lanka Buddothpado ".

Come and join us to see the truth .

Theruwanasaranai

**Lalana Weerasena**



# Nibbana is within You

When we take the last few decades , we used to think that Nibbana is "something " which we have to go and find . So ,we had this endless journey of going from temple to temple, listening to various types of Sermons from different Monks , reading mountains of Dhamma books , wasted time in retreats , doing concentration Meditation and so on. But with the same time within us we had the feeling that this is not we are searching for.

But once we met Buddothpado Sermons we instantly knew this is what we were searching for all these years. When listening to Buddothpado Sermons we came to know that Nibbana or Liberation of Mind can not gain by knowledge , its something you have to gain within. It's a realisation beyond thoughts. To gain this wisdom , first we have to understand how the Mind is created.

To understand how the Mind is created we have to go back to the Radiant Mind of a new born baby. A new born baby comes to this world with a pure and untainted Mind. He is free from perception of "Self" ,there is no duality.
He does not know his parents, siblings or his surroundings either. But he has the sensation of light , sound and feel.

Once he grows up he is introduced to the world by giving a name and sound .For example showings the Mother and giving the sound "Amma" This is done repeatedly until the baby grasps it.

Likewise all the objects are introduced , building up the child's world. With these concepts, language the "Me" or "Self " also created and so is the "duality". This duality gives power. It's there and I m here. But all are perceptions, concepts with time, these perceptions gains power and

gives the feeling that there is an existing external world. And we believe in this illusionary World due to Ignorance. Due to Ignorance we tend to think that an external world exists and with that creates defilements towards objects. Now the Radiant Mind is covered with defilements. As long as the defilements creates no-one can achieve Nibbana.

However now we can hear True Dhamma which says "Don't go searching for Nibbana because it was always within you"
If you understand this statement which Lord Buddha has quoted 2500 years ago ,you will find the answer within.

When one listens to True Dhamma with the correct vision (Samma Ditti) and wisdom, you would be able to see through the Illusion, also you will feel it as a direct experience. Once you Contemplate deeply and the understand deepens you will realise how the light and sound is created due to Vibrations and how the Telepathy system creates .You will also realise that this is all a Natural Phenomena. The Mind creation is a Natura process.

As the wisdom transceds the Ignorance the Vibrations losses its power to Telepathise and the illusionary "Self" begins to dissolve slowly but steadily .And you are in the path to Liberation from Mind.

So, don't go around seeking for Nibbana elsewhere because it is always within you ,actually if you don't feel any burning within for anything that's where you find Nibbana. Ultimately what you gain is tranqility and solace and inner peace.

Buddothpado Sermons will guide you to find this inner peace .

Theruwan Saranai!
**Chandani Wijesekara**



# බුදු සිත ඇති දරුවන්

"මේ සිතේ ස්වභාවය තමයි එය හැම විටක ම කුමක හෝ ගැට ගැසී පැවතී ම. සිතේ ද්වතාවක් තිබෙනවා. දරුවෙක් වැඩෙන්නේ අම්මාට හෝ තාත්තාට ගැට ගැසිලා. කොතනක හෝ සිත ගැටගැසෙනවා. පුංචි දරුවොත් එහෙමයි. එක්කෝ අධ්‍යාපනයට හෝ ගැට ගැසිලයි ඔය ඉන්නේ. එය කැඩුවොත් ඒ දරුවා විනාශ වනවා. ඒ ගැටගැසුන තැන සෙවිය යුතුයි.

වැඩිහිටියන් පවා එහෙමයි. එක්කෝ මුදල්වලට, නැති නම් රස්සාවට ගැටගැසිලා. විවාහක යුවල අතර තිබෙන බන්ධනයත් ඒ ආකාරටයි. ආදර කතා ගොඩනැගෙන්නෙත් ඒ නිසා ම යි. මෙය ලෝක ස්වභාවයක්.

ගුරුත්වාකර්ෂණ බලය පවා තිබෙන්නේ අන්ත දෙකක දෝලනයෙන්. බල දෙකක් දෙපැත්තෙන් දෝලනය වනවා. මේ සිතේ ස්වභාවයත් ඒ ආකාරමයි. සිත කොහේ හෝ ගැටගැසිලයි තිබෙන්නේ. ඒ ගැටගැසුන තැන් සොයා ගත යුතුයි. ඒ ගැටගැසුන තැන්වලින් නිදහස් වුවහොත් ඇත්තට ම සැනසීමක් ලැබෙනවා."

**බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේ**
BUDDHOTHPADO YOUTH සිතුවිලි ගිනි නොගන්නා සුන්දර දරුවෙක් වන්නට (උපුටනයකි- ආරම්භයේ සිට විනාඩි 1.20 දක්වා)



# සැබෑ බෞද්ධයෙකු වන්නේ කෙසේද?

අපේ රටේ සංස්කෘතියට අනුව බෞද්ධ පවුලක ඉපදුනොත් උප්පැන්නට අනුව බෞද්ධ වෙනවා. දෙමාපියෝ බෞද්ධ නම් දරුවත් බෞද්ධ වෙනවා. කෙනෙක් බෞද්ධ වන්නේ බෞද්ධ පවුලක ඉපදීමෙන් නොවේ. භව නිරෝධය දැකීමෙන්. භව නිරෝධ වන්නේ කොහොමද? එනම් අරමුණ තුළ සත්‍ය දැකිය යුතුයි. බාහිර ඇත්ත කරගත් අරමුණේ සත්‍ය නොදකින කෙනා බෞද්ධයෙකු නොවේ. අජ්ජෝසාය තිට්ඨති - අරමුණ බැසගත් විට 'යා රූපේ නන්දි' - එයට බලයක් ලැබේ. 'තදූපාදානං භවෝ' - දෙයක් තියෙනවා වගේ දැනෙන බලයක් ලැබේ.

ඔබට දැනෙනවා නම් මේ මොහොතේ ඔබ දකින බිත්තිය තියෙනවා කියලා ඔබ බෞද්ධයෙක් නොවේ. බිත්තිය යනු ශබ්ද වර්ණ ගන්ධ රස පහස එකතු වුන සිතුවිල්ලක්. එය විඥ්ඥාන මායාවක්. ඒ මායාවේ සත්‍ය දකින කෙනා බෞද්ධයෙක් වෙනවා. අසරණකමින් මිදෙනවා. මේ බුද්ධ ශාසනය හමුවෙන්නේ පන්සල් වලවත් ගොඩනැගිලි වලවත් නොවේ, බුද්ධ ස්වභාවයට අවධි වෙන සිත තුලම බොජ්ජංග ධර්ම වැඩීගෙන ශාසනය අවධි වීගෙන එනවා. ඒ තුලම ඔබ නිවන කරා යනවා. අරමුණේ දෙයක් වගේ දැනෙන ස්වභාවය ආත්මීය දැනීමක් භවය කියන්නෙත් ඕකමයි. ඔය අරමුණේ ඇති වටිනාකම ආරෝපණය, උද්දීපනය, නන්දිය නැති වීමට නම් අරමුණ තුළ සත්‍ය දැකිය යුතුයි. 'සබ්බ පාපස්ස අකරණං' කියන්නෙ සිතුවිලි එයමයි විඤ්ඤාන මායාව. එහි සත්‍ය දකින එක 'කුසලස්ස උපසම්පදාවයි.' 'සචිත්ත පරියෝ දපනං' එහෙම වුනොත් තමයි චිත්ත දමනය සිදුවන්නේ. මේ චිත්ත දමනය තුළින් සැහැල්ලුව බුද්ධ ස්වභාවය ඇති වෙනවා. ඒතං බුද්ධානං සාසනං අන්න සියලු බුදුවරුන්ගෙ අනුශාසනාව එයයි.

බාහිර ඇත්ත කරගත් මිත්‍යා දෘෂ්ඨික භූමිය නිසයි මිනිස්සු සිත කය වචනයෙන් නොයෙකුත් අකුසල් කරගන්නේ. නමුත් බෞද්ධ දර්ශනය අනුව ගිය කෙනෙක්ට බාහිර දෙයක් නැති වෙනවා. මිනී මරන්න සොරකම් කරන්න රණ්ඩු කරන්න බාහිර කෙනෙක්වත් දෙයක්වත් හමුවෙන්නෙ නෑ. ඔහු ධර්මය දකිනවා. ධම්මෝ හවෝ රක්ඛති ධම්මචාරී හවේ රක්ඛති කියන තැනට එනවා. බාහිර දෙයක් තියෙනවා කිව්වත් වැරදියි නෑ කිව්වත් වැරදියි. හේතු තියෙනකොට තියෙනවා. හේතු නැතිවෙනකොට නැතිවෙනවා. ඔබ මේ මිත්‍යාදෘෂ්ඨික භූමියෙන් මිදීමටනම් මේ විඤ්ඤාන මායාව සකස් වනන ආකාරය දැකිය යුතුයි. මේ හැම සිතකම සත්‍යය දැකිය යුතුයි. ඔබ දකින්නේ ඇසුරු කරන්නේ බාහිර ලෝකය නොව සිතුවිලි ලෝකයයි.

සමහරු මේ බුද්ධ ශාසනයේ නිවන් දකින්න බෑ කියලා හිතනවා. පතනා බෝධියක් එනතුරු බලන් ඉන්නවා. ඇතැම් අය ආමිස පූජා වලට ගැටග ැහිලා ඉන්නවා. පිටකයට ගැටගැහිලා ඉන්නවා. බුදුන් වහන්සේම දේශනා කරනවා මහෝපදේශනා සූත්‍ර තුල යමෙක් කිව්වට පිළිගන්න එපා. ඇහුවට පිළිග න්න එපා. දක්කට පිළිගන්න එපා පොතේ තිබුනට පිළිගන්නත් එපා. මම කිව්වා කියලා මම මෙහෙම කියලා තියෙනවා කියලා කියයි. ඒත් පිළිගන්න එපා කියලා බුදු මුවින්ම දේශනා කරලා තියෙනවා. මේ දහම විශ්වාස කරන එකක් ඇදහිල්ලක් පුද්ගල සරණ යාමක් නොවෙයි. ඔබ ධර්මය පමණක් විශ්වාස

කරන්න. මේක නාමරූප උපරූජ්ජනය වන දහමක්. සත්ව පුද්ගල ආත්මීයක් නැති දහමක්. ඒ වගේම බුදු දහම කියන්නෙ තුන්කාලයකට දාන්න බැරි අකාලික දහමක්. අපි බුද්ධ ධර්මය කියලා හිතාගෙන වෙනත් සංකල්ප ගොඩක් කාරේ තියාගෙන ඒ සංකල්ප වල හිරවෙලා ඉන්නකන් බෞද්ධයෝ කියලා කියාගන්න විශාල පිරිසක් ඒ තුල හිරවෙලා සිටීම විශාල අපරාධයක් වෙනවා. මේක සාන්දිට්ඨික අකාලික මේ මොහොතේම ප්‍රත්‍යක්ෂ වන දහමක්.

සාමාන්‍ය පෘථග්ජන කෙනාට හිතෙන්නෙ මේ ඔක්කොම දෙයක් කියලා. මේ පේන්නෙ මට, කන්නෙ මම වැඩකරන්නෙ මම මේ පේන දේවල් තියෙනවා. මමත් ඉන්නවා ඒක් නිසා මට දුක එනවා. එයා නිසා මට දුක එනවා. මේක පෘථග්ජන ස්වභාවය. මිදෙනකොට අන්න එනවා ඝානමය ඥානය. ශ්‍රුතවත් ශ්‍රාවකයා දැනගන්නවා මෙතන දෙයක් නෑ කියලා. දෙයක් නැත්නම් මමත් නෑ. සිතුවිලිවලත් දෙයක් නෑ. බාහිරත් දෙයක් නැති තැන සිතුවිල්ලෙත් දෙයක් නැති තැන එයා කම්පනයක් නැති සැහැල්ලුවක් අත් විඳිනවා. දෙයක් නැති නම් ආත්මයකුත් නෑ. මේ අනාත්ම දහම හඳුනාගැනීම සත්‍ය ඥානය තුළයි සිද්ධවෙන්නේ.

බුදුන් වහන්සේ පෙර නොඇසූ විරූ දහමක් ලෙසට පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු කියලා ලෝකයට හෙළි කළේ ඔය පණිවිඩයයි. පස්වග තවුසන්ගේ කොණ්ඩඤ්ඤ තාපසතුමා මේ දහම අසන මොහොතේම ලෝකයක් නැති බව දෙයක් නැති බව අවබෝධ කරනවා. මේ ශාසනයේ පළමු වන ශ්‍රාවකයා වෙන්නේ කොණ්ඩඤ්ඤ තාපසතුමායි. මේ ශාසනයේ පළමුවෙනි භික්ෂුව, ශ්‍රමණ කොහෙන්ද හැදෙන්නෙ, ධර්ම ශ්‍රවණය තුළයි. කල්‍යාණ මිත්‍රයා මතමයි ආනන්දය ශාසනය පවතින්නේ කිව්වෙ ඒකයි.

මේ බුද්ධ දර්ශනය විදර්ශනා ධූරය තුල කවුරු හරි සත්‍ය මතු කරලා ගත්තොත් එය ලෝකයට හෙළි කරොත් බුද්ධ ශාසනය බැබලෙනවා. අද ඒ කර්තව්‍යයි බුද්ධෝත්පාද දේශනා තුළින් සිදුවන්නේ. ලොව පරම සත්‍ය ආගමකට අයිති නෑ. බුදුන් වහන්සේ ධර්මය දේශනා කලේ සියලු සත්වයන්ට දුකින් නිදහස් වෙන්නයි. ඇත්තටම ඔබ සැබෑ බෞද්ධයෙක් නම් බණ කියන්න අවශ්‍යත් නෑ. බුද්ධ ධර්මය තුල ඇත්තේ නිවන් මඟයි. නිවන ඇත්තේ භවයෙන් මිදුනු තැනයි. භවය පතන කෙනා බෞද්ධයෙකු නොවේ. දිව්‍ය ලෝකයක යන්න බලන් ඉන්නවානම් දිව්‍ය ලෝක පතනවානම් ඔහු බෞද්ධයෙක් නොවේ. අද සමාජය බුද්ධාගම කියලා අල්ලාගෙන ඉන්න එකක්වත් බුදුන් වහන්සේ පනවන ප්‍රතිපදාව තුල නෑ. ගාථා කිව්වට, පිරිත් නූල් ගැටගැසුවට කොඩි උස්සන් ගියාට, ධාතු වන්දනාවේ ගියාට පළතුරු වට්ටි පූජා කළාට නිවන් දකින්නේ නෑ. බුදුන් වහන්සේ දේශනා කරනවා තෙලින් මලින් මා පුදන්නෝ - මා පුදන්නෝ නොවෙති. ප්‍රතිපත්තියෙන් මා පුදන්නෝ - මා පුදන්නෝ වෙති. අන්න ඒ ප්‍රතිපදාවයි බුද්ධෝත්පාද දේශනා හරහා ලොවට විවර වෙන්නේ. දාන දාහක් දෙනවට වඩා එක් මොහොතක් සිතේ සත්‍ය දකීනම් බුදුන් වහන්සේ අගය කරන්නේ එයයි.

මෙලොව ලොකුම දානය දීපු මල්ලිකා දේවිය සතර අපායට වැටුනේ ඇයි? අසූ හාර දාහක් වෙහෙර විහාර හදපු අශෝක අධිරාජයා දුගතියට වැටුනෙ ඇයි? ප්‍රතිපදාව වැරදි නිසා. සත්‍ය ඥානය නැති නිසා. දර්ශනය නොදත් නිසා. එහෙමනම් ඔබටත් එසේ වීමට ඉඩ තියෙනවා. සෑම බෞද්ධයෙක් තුළම නිවැරදි ප්‍රතිපදාවක් තිබිය යුතු වෙනවා.

අද බෞද්ධ සමාජය ඇදහිලි විශ්වාසවලින් අන්ධ වෙලා ඉන්නේ.
බුදුන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරලා බුදු බව ලබාගෙන දේශනා කළේ හැම ආගමක තියෙන දිව්‍ය ලෝක කථාව නොවේ. උතුම් මනුෂ්‍ය භවයක් ලැබිලා අද අපි උමතුවෙන් දුවනවා. මරණය අභියස ඔබේ තරාතිරම, ගේ දොර, වතු පිටි කිසිවක් වලංගු නෑ. දිව්‍ය ලෝක, බ්‍රහ්ම ලෝක, සත්ව ලෝක ඔය හැමතැනම මරබිය තියෙනවා. නමුත් මේ දහම අවබෝධ කරන කෙනා මරණයත් සිතුවිල්ලක් බව දකිමින් මරණයත් ජය ගන්නවා. ඔබ ඔබේ සිතේ සත්‍ය දකින විට සිතේ මායාව දැක සිතින් සිත මිදෙන විට ඔබට සෝවාන් මාර්ග සිස පහළ වෙනවා. මෙලෙයසි ආර්ය භූමියට ප්‍රවේශ වන්නේ. මෙලෙයසි ඔබ භව නිරෝධයට පත්වෙන්නේ. භව නිරෝධය නොදකින තාක් ඔබ බෞද්ධයෙකු නොවේ. ඒතාක් ඔබ මිත්‍යා දෘෂ්ඨිකයි. මෙය අවබෝධ කර ගත් කෙනා සම්මා දිට්ඨියට එනවා.



# දැනුම අභිබවා ගිය අභිඥද්ඥදා ඥදානය

2 වන කොටස

ආර්යයන් වහන්සේ: දැන් ඔබතුමී බලන්න දැන් හිත ද මැරෙන්නෙ කයද මැරෙන්නෙ. හිතනෙ මැරෙන්නෙ. හිත නැති නිසා නේ කය වළලලා දාන්නෙ. දැන් ආශ්වාස ප්‍රශ්වාස වෙනකම්ම ස්පාක් එකක් වෙනවනේ ප්‍රසාදයක් වෙනවා නේ. එතකොට ආශ්වාස ප්‍රශ්වාස වෙනකන්ම ප්‍රසාදය අර පුංචි දරුවාගේ අර ඇහැට එන්නේ වර්ණය කනට ශබ්දය අර මොන්ටිසෝරියේ පුතේ මේ කහපාට රතුපාට yellow red blue කියලා ඔතනින්නෙ පටන් ගත්තෙ ඔබතුමියත් ඉගෙන ගන්න.

උපාසිකාවා: එහෙමයි.

ආර්යයන් වහන්සේ: එතකොට එතන පළවෙනි තැන නෙ අර මොන්ටිසෝරියේ පාට ටික දීපු එක. yellow red blue එතකොට අපිට ඇහැට දුන්නනේ වර්ණය දීලා කනට දුන්නනේ ශබ්දය. දුන්නහම ඒ ශබ්දයයි වර්ණයයි එකතු උනා නේ. එතකොට මේ පැත්තෙ පිච්ච මල කිව්වොත් ඔය පැත්තට පිච්ච මලක් මැවෙනවා නේ.

උපාසිකාවා: එහෙමයි.

ආර්යයන් වහන්සේ: එතකොට ඔය රූපයක් මැවෙන්නෙ කොහොමද? ශබ්දයක් එනවනේ. ශබ්ද තරංගයි වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනවා කිව්වේ ඒක දැන් හරි නේද?

උපාසිකාවා: හරි හරි හරි.

ආර්යයන් වහන්සේ: එතකොට ඕක ඇවිල්ලා විද්‍යාවක් නේ. එතකොට ආත්මය කොහෙද තිබ්බේ. ආත්මය කියන්නේ එය චිත්ත තරංගය.

උපාසිකාවා: ආත්මයක් කියල එකක් නෑ ඇත්තටම.

ආර්යයන් වහන්සේ: සිස්ටම් එකක් තියෙන්නේ. මේ සිස්ටම් එක තමයි අර දැන් අර ඉස්සරහට අපි කිව්වේ අර ටර්මිනේටර් වගේ හදලා සෛල හිටන් වර්ධනය වෙන්න හදන්න පුළුවන්, ඊට පස්සේ බොඩි එක ඒ විදිහටම තියෙයි, හැබැයි මේකෙ මේ සිස්ටම් එක දාන්න පුළුවන් කියලා අපි කිව්වේ. මේ සිස්ටම් එක ට්‍රිලියන ගාණක් වෙන්න පුළුවන් sim card එක වගේ, මේ ස්පාක් වෙන සිස්ටම් එක දැම්මොත් මේ සිස්ටම් එක ගන්න පුළුවන් සෙන්සස්වලින් සෙන්සස්වල සිස්ටම් එක ගන්න පුළුවන් circuit එකකට ගත්තොත් එහෙම මේ සර්කිට් එක apply කරොත් ටර්මිනේට් එකට, ඇත්තම කිව්වොත් සීයක් ගැහුවොත් කොපි සීයක් ගැහුවොත් අර එක්කෙනෙක්ගෙ තියෙන අර අර ස්නායුවල තියෙන අර දෙයක් දැක්කම එන වර්ණ, ශබ්ද, මේවා ටික ස්පාක් වෙන ඒ ටික ට්‍රිලියන ගාණක් වෙන්න පුළුවන් සංඥා, නමුත් ඒ ටික ඔක්කොම සිස්ටම් එකට ගත්තොත් එක ජසරජමසළු එකකට ගත්තොත් ඒක sim card එකට වගේ ගත්තොත් ඒක අර වගේ ටර්මිනේටර් ගැහුවොත් ඒ විදිහටම දෙයක් එනකොට මෙයාට එන දේ ම එයාටත් එනවා. ඇත්තටම එතන ආත්මයක් නැති වෙනවා. ඇත්තටම කිව්වොත් අර සීයක් ගැහුවොත් copie ඒ කියන්නේ සීයම ටර්මිනේටර් වෙලා ඒකත්ත සංඥා ඒකත්ත කායා, එකම සංඥාව ඒ කියන්නේ මෙයාට එන සංඥාව ඔක්කොටම එනවා. ඒකට හේතුව ආත්මයක් පනවන්න බෑ. මේකෙ ආත්මයක් නෙමෙයි තියෙන්නෙ සිස්ටම් එක තමයි අර සර්කිට් එකේ ගහන්නේ. සිස්ටම් එක ගැහුවාම සිස්ටර් එක සමාන වෙනවා. ඒක නිසා තමයි බුදුන් වහන්සේ කිව්වේ ඒකත්ත කායා, ඒකත්ත සංඥා කියලා. එකම කය තියෙනවා එතකොට එක රූපය ටර්මිනේටර් සමානයි. ඒවගේම එකම සංඥාව. මොකක්ද එන සංඥාව එක සමාන ප්‍රතිචාර.

ආත්මයක් නෑ කියන එකයි තේරුම. නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ. සිස්ටම් එකක් විතරයි. ධර්මතාවක් විතරයි. "ධම්මං විනා නත්ථි" කිව්වේ කිසිම දෙයක් හම්බ වෙන්නේ නෑ. මේ ධර්මය අවබෝධ කරනවා කියන්නේ සිස්ටම් එක අවබෝධ කරනවා. ඒ සිස්ටම් එක අවබෝධය කරහම නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ ආත්ම කතාවක් නැති වෙනවා. හැබැයි මේක frequence වෙනවා. ඒ කියන්නේ දෘෂ්ටිය තුළ බාහිර ඇත්ත කරගත්ත තැන තුළ අර අපි කිව්වේ මේකේ ටයර් එක කැරකෙන කොට ඩයිනමෝව කැරකිලා අර කරන්ට් එක හැදෙනවා වගේ, වාහනයේ ටයර් එක කැරකෙන කොට අර battery charge වෙනව වගේ, මෙතන තණ්හාව, ඒ කියන්නේ දෙයක් තියෙනවා කියලා ගන්න කොට ආරෝපණයක් එනවා, බලයක්, ඒකට චිත්තාරෝපණ කිව්වේ ඒකයි. ගුරුත්වාකර්ෂණ බලය වගේ, ගුරුත්වාකර්ෂණය වගේ, විද්‍යුත් ආරෝපණය වගේ, චිත්තාරෝපණය. ඒ කියන්නේ මෙතන දෙයක් තියෙනවා කියලා ගන්න කොට ඒක ආරෝපණය,

උප්ජිත්තති, "රුප්පන්තිකෝ ආයුසෝ රූපං" කිව්වේ ඒකයි.

රුප්පනය වෙනවා, ස්පාක් වෙනවා, ෂෝට් වෙනවා, දෙයක් දකින කොට ස්පාක් එකක් වෙනවා. අන්න ඒක තමයි අපි විඳින එක, චූන් එක, උද්දීපනය. ඒ උද්දීපනය තමයි අපිට මේ බලගැන්විලා රාග ද්වේෂ මෝහ අපි කියන්නේ එක්කෝ ඇලෙනවා එක්කෝ ගැටෙනවා. කොයි පැත්තට හරි විභේදනය වෙනවා. ඒව මොකද වෙන්නේ, මේකෙ ස්පාක් එක තමයි වැදගත් වෙන්නේ. ඒ කියන්නේ මෙතන තියනව වගේ දැනෙන සිස්ටම් එක, ඇත්තටම කිව්වොත් තරංග සිස්ටම් එකක්. මෙහෙත් සිරස බලනවා ටීවී එකේ, යාපනෙත් සිරස බලනවා ටීවී එකේ, ඇමරිකාවේත් සිරස බලනවා ටීවී එකේ. හැබැයි ඇත්තටම මෙතන ටීවී එක කැඩුණොත් මොකද වෙන්නේ, ඒත් යාපනේ ටීවී එක වැඩ කරනවා වගේ, ඒ කියන්නේ මෙතන ශරීර කූඩුව පොළොවට පස් වෙනකොට මේ තියෙන frequence එක තව තැනකට ටෙලිපති වෙනවා. සකස් වෙනවා. මේ ශරීර කූඩුව පොළොවට පස් වුණා ටීවී එක කැඩුණා, හැබැයි මේ සර්කිට් එක වගේ ඒරියල් එක. ඒ කියන්නේ ආයතන ටික, සළායතන, ආයතන ටික තියෙනවා නම් අන්න චිත්‍රපටිය වගේ පේනවා. සිරස, දෙරණ, හිරු වගේ. අර මෙතන තියෙන සර්කිට් එකේ දැන් දෙරණ ද හිරු ද මොකක්ද කියන එක තියෙන්නේ ඒ අල්ලන frequence එක අනුවයි. ඒ කියන්නේ රාග, ද්වේෂ, මෝහ ස්වභාවය අනුවයි. රාග, ද්වේෂ මෝහ ස්වභාවය අනුව තමයි මානීය මක්කටෝ අතිමානීය කුක්කුරෝ කියන එක ගති නිමිති කම්ම නිමිති කියල කිව්වෙ. ඒ කියන්නේ අපි ගාව තියෙනවා මේ බන්ධන බලය. ඒ කියන්නේ ආරෝපණය. රාග, ද්වේෂ, මෝහ කොයිතරම් ද ඒ තරම් තමයි ගණ සංඥා කියලා පහළ ලෝක පෙන්නුවේ. ඒ රාග, ද්වේෂ, මෝහ තුනීවෙන තරමටයි සුගති පරායන කිව්වේ. එහෙනම් අපිට මේ ලෝකේ තියෙනවා කියලා ගත්ත තැන, ලෝක සංඥා තියෙන තැන, "තණ්හා නමැති වඩුවා තා මා දිටිමි, තාට නැවත නිවසක් සෑදීමට ඉඩ නොදෙමි" කිව්වෙ. ඒ කියන්නේ මේ රාග, ද්වේෂ, මෝහ තුනී වෙන තැන අන්න සුකුම වෙලා සුකුම වෙලා සුකුම වෙලා නොදැනෙන ස්වභාවයකට ගියා කියන්නේ නිෂ්ක්‍රීය ස්වභාවයක් වෙලා අර කරන්ට් එක දියවෙලා ගියා වගේ. ආත්මීය ආරෝපණය දියවෙලා ගියා. අන්න ක්ෂීනාශ්‍රව රහතන් වහන්සේ. එතනයි නිවන. ඔබතුමිය එතන්ට තමයි යන්න හදන්නේ.

උපාසිකාවා: දැන් එහෙම ඇත්තටම අඩු වෙවී අඩු වෙවී යනවා. හැබැයි.

ආර්යයන් වහන්සේ: ඕක අඩු වෙන්න, දැන් ඔබතුමී බලන්න දැන් පොත තියෙන්නේ අපි එළියෙ කියලනෙ ගන්නෙ. දැන් ඇහැට එන්නේ වර්ණයක් නේ. ඒකත් එක්කම ශබ්දෙ එනවනේ. ශබ්දෙ කොහෙන්ද ආවේ. අර පුංචි දරුවාට දීපු ශබ්ද වර්ණ එකට එකතු වුණ එක ස්පාර්ක් එකක් නේ. ඒක මේ මොහොතෙත් spark වෙනවනේ දිගටම තාම දුවනවා නේ. ගඟ ගලනවා වගේ දිගටම තාම ස්පාර්ක් වෙවී තියෙන්නේ. හුස්ම වැටෙන කම්ම තියෙනවා. හුස්ම වැටෙනවා කියන්නේ හෘදය ස්පන්දනය වැඩ කරනවා, පෙනහලු වැඩ කරනවා, දිගටම ස්පාක් එක, ආරෝපණය, අපේ තියනවා ඕරා එක. ඒක ස්නායු පද්ධතිය ඔස්සේ කරන්ට් එක තියෙනවා. එහෙනම් ඒක දිගටම තියනවා කියන්නේ ස්පාක් එක දිගටම සිද්ධ වෙනවා. ඒක අඩු වැඩි වෙන්නෙ අර රාග, ද්වේෂ, මෝහ ස්වභාවය අනුවයි. තාත්තට එකළොස් දාහෙන් ස්පාක් වෙනවා. දරුවට පන්දාහෙන් ස්පාක් වෙනවා කිව්වේ ඒකයි. රාග ද්වේෂ මෝහ ප්‍රමාණය අනුව තමයි ස්පාක් තියෙන්නේ. ඒක තමයි ආරෝපණය. අපි එතකොට ආත්මය කියන්නේ ඕකටයි. ආත්මෙ කියන්නේ ස්පාක් එකටයි. ආත්මීය දැනීම, ඒකයි අපට ලෝකයක් තියෙනවා අරවා තියෙනවා මේවා තියෙනවා, අපි දාපු දත්ත ටිකක් විතරයි. ඒව කොහේවත් එහෙම එකක් නෑ. ඇස් පේන්නෙ නැත්නං, අන්ධ නම්, කළු පාටයි ද ලෝකෙ කියල අහන්න හිතෙන්නේ ඒකයි. දැන් ඔබතුමිය අන්ධ වුණොත් කළුද ලෝකෙ? අන්න ඒ වගේ මේක හදා ගත්ත නිකං වර්ණ ටිකක් හදාගෙන ඒක තුළ නිකං අපි අතරමං වෙලා නිකං අපි පිස්සුවෙන් වගේ ඔබතුමිය වගේ ඉන්න එක තමයි පෘථග්ජන උන්මත්තකයො කියලා කිව්වේ.

උපාසිකාවා: ඒක තමයි, ඒක ඇත්තම ඇත්ත.

ආර්යයන් වහන්සේ: ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස, උණුසුම, සීතල, තද ගතිය කියන මේ සෙන්සස් ටික සම්පූර්ණයෙන්ම ෆැන්ටසි එකක්.

උපාසිකාවා: ෆැන්ටසි එකක් ම තමයි.

ආර්යයන් වහන්සේ: ඇත්ත ලෝකෙ දකින හීනේ. මේ සත්‍යයට අවදි වෙන්න පුළුවන් නුවණින්, සත්‍ය දැකලා ඔබතුමිය අවදි උනා වගේ. දැන් කණ්ණාඩියෙන් දැකපු රූපය මමය කියලා හිතාගෙන මේ කර්කජ කය මමය කියල හිතුවට ඒක සිතුවිල්ලක් විතරයි. ඒකයි අපි කිව්වේ හිතට තිබහයි කිව්වට හිතට වතුර බොන්න බෑ. කටට දානවා, බඩට යනවා, එළියට යනවා. හිත බඩගිනියි කිව්වට හිත බත් කාලා නෑ කටට දානවා, බඩට යනවා, එළියට යනවා. හිත ඇවිදිනවා කිවවට හිතට ඇවිදින්න බෑ. හිතට ආදරය කරනවා කිව්වට

හිතට ආදරේ කරන්නත් බෑ. හිතට කිසි දෙයක් කරන්න බෑ. එතකොට හිත කියන්නේ දෘෂ්ටියක් විතරයි. ශක්තියක් විතරයි. අර විද්‍යුත් ආරෝපණය විතරයි.

එතකොට මේ ආශ්වාස ප්‍රශ්වාස නවතින කොට අන්න ඒ ස්පාක් එක නවතිනවා. එතකොට මොකද වෙන්නේ? අන්න හිත නෑ. එතකොට වැඩක් තියෙනවද කය. අන්න ගිනි තියලා දානවා. දැන් මම කියන්නේ කය ද හිත ද? හිතයි. ඒක පවතිනවාද? නෑ, එතන එතන ස්පාක් වෙනවාටයි හිත කිව්වේ. ගඟ ගලනවා, වැස්ස වහිනවා, හුළඟ හමනවා කියන්නේ මේ ස්පාක් වෙන වේගයටයි. අන්න තියෙන බිත්තියක් වගේ පෙනුණට තප්පරේට කෝටි වාරයක් ස්පාක් වෙලා තමයි ඕක තියෙනවා වගේ පේන්නේ. අර කාටුන් එකක් යනකොට වේගයෙන් පින්තූර ගොඩාක් යනකොට තියෙන චිත්‍රපටියක් වගේ පේන්නේ.

අන්න ඒ වගේ ප්‍රොජෙක්ටරයක් වගේ තමයි මේ සිත වැඩ කරන සිස්ටම් එක. ඕකට කියන්නේ සංඛාරා කියලා. සබ්බේ සංඛාරා මේ වේගය තුළ මැවෙන සංඛාර තමයි. ඒක තමයි විඤ්ඤාණයෙ දැනගැනීම වෙලා චිත්‍රපටිය පේන එක. මේක හරියට නිකං විද්‍යුත් මෙවලමක් වගේ.

උපාසිකාවː ඒක නං ඇත්තම තමයි මට හිතුණෙ දැන්.

ආර්යයන් වහන්සේː දැන් ඔබතුමිය ආයිමත් අපි අහනවා. අවුරුදු හැත්තෑ හතරයි වයස. මහාචාර්යවරියක්. ඔබතුමිය බොහොම කෙටි දේශනා ප්‍රමාණයකින් ධර්මය අල්ලලා තියෙනවා. ඔබතුමිය කියපු විදිහට ඔබතුමිය සීයක් අහලා නෑ. නමුත් ඔබතුමිය මේක ගත්තා. හැබැයි ගත්තෙ ඔබතුමියගේ මහා ප්‍රඥාවක් තියෙන නිසා, නුවණක් තියෙන නිසා. හැබැයි ඔබතුමියගේ තියෙනවා දෝෂයක්. ඒක තමයි දීර්ඝ කාලයක් තිස්සේ ගණ සංඥා වැදිලා තියෙනවා. ඒක නිසා ආත්මීය දැනීම තදට තියෙනවා. හැබැයි ඔබතුමියට මේක කියන කොට තේරෙනවා මෙතන ආත්මයක් නෑ කියලා. හැබැයි ඔබතුමියට ඒක තමා දැනෙන්නෑ. එහෙම නේද?

උපාසිකාවː ඔව් ඒක මට ඒක කියන කොට තේරෙනවා. ඒ උණාට.

ආර්යයන් වහන්සේː තේරුණාට දැනෙන්නෙ නැත්තෙ අවුරුදු හැත්තෑ ගාණක් ඔබතුමියට සනට තාම වැදිච්ච එක. අන්න බුදුන් වහන්සේ ප්‍රතිපදාව පැනවූයේ ඒකයි. මේ සංඛාර කියන්නේ සංඛත කියන්නේ වේගය තුළ සකස් වුණු අභිසංඛරණයක්. බඹරයක් වගේ කැරකීම තුළ අර ගිනි වළල්ලක් හැදිලා තියෙන්නේ වේගෙට කැරකෙන. ඔබතුමියට දීර්ඝ කාලයක් තියෙනවා කියලා දීලා තියෙනවා බලගැන්විලා. ඒක නැති කරන්න නම් දීර්ඝ කාලයක් ඒ කියන්නේ ඔබතුමියට යම්කිසි කාලයක් සත්‍ය දකින්න වෙනවා. දෙයක් නැති බව. තියෙනවා තියෙනවා කියලා දැකපු දේ නෑ නෑ කියන පැත්තට යන්න වෙනවා. ඒක කියනවා නෙමේ වචනයෙන් අභ්‍යන්තරයෙන් මෙනෙහි වෙන්න ඕන. අන්න එතනයි "සබ්භූපති පටිනිස්සගෙ ා" කියන තැන ඔබතුමියගෙ නිවන් මග හමුවෙන්නෙ. ඔබතුමියට වෙන දෙයක් නෑ. ඔබතුමියට සත්‍ය ඥානය තුළ දැන් ගොඩක් දේවල් දන්නවා. ඔබතුමියට අවබෝධයක් තියෙනවා. දැනුම හරි. ඔබතුමියට දැන් තියෙන්නේ ප්‍රායෝගික පැත්ත. හැබැයි ඔබතුමිය කරනවා නෙවෙයි ඔබතුමිය නිවන් දකිනවා. ඔබතුමිය කරනවා නෙවෙයි ඔබතුමිය දැන් ඉන්න මට්ටම හොඳයි. ඔබතුමිය නිරායාසයෙන්ම ගඟට ඇලවුණු ගස වගේ ගඟටමයි වැටෙන්නේ. මහණෙනි කිව්ව වගේ නිවනින්ම සැනසීම ලබනවා ඔබතුමිය. නියත සම්බෝධි පරායණයි.

උපාසිකාවː ඔබ වහන්සේගේ ධර්මය නිසා තමයි. ඔබ වහන්සේ පෙන්නපු විදිහ, නැත්නම් මම බණ අහල තියෙනවා. ඒත් ඔබ වහන්සේ ඒ කියපු ටික හරිම spirit එක වගේ ඒක.

ආර්යයන් වහන්සේː ඔබතුමිය ස්ප්‍රිට් එක වගේ ළමයින්ට උගන්නන්න ඇතිනේ. ඒක නිසා ඒ කරපු, සමහරවිට ඒකෙ ප්‍රතිවිපාක වෙන්න ඇති අපි ස්ප්‍රිට් එක වගේ ඔබතුමියට සත්‍ය දෙනවා. එහෙම නේද?

උපාසිකාවː මේ විදිහට බලාගෙන මේ විදියට දිගට කරනකොට.

ආර්යයන් වහන්සේː ඔබතුමිය කරනවා නෙවෙයි ඔබතුමිය නිවනට පත් වෙනවා.



# බුදුන් දකිමු

වර්තමානය කෙතරම් නවීකරණයෙන් පොහොසත් දැයි සිතිය හැකි නමුදු අප බුදුනු සමාජය මහා මිත්‍යාදෘෂ්ටි ගොඩක පැටලී සිටින බව පැහැදිලි ය. එය අපට මැනවින් පැහැදිලි වූයේ බුද්ධෝත්පාද දේශනා ඇසීමෙන් පසුව ය. ඒ තාක් අපි ද ආමිසයට හා සමථයට මුල් තැන දෙමින් පාරමිතා සහ පතනා බෝධි අදහමින් නිවන ප්‍රාර්ථනා කරමින් සිටියෙමු. මෙසේ සිටි අප තෙරුවන් සරණ යාම කටවචනයට පමණක් සීමා නොවී ප්‍රායෝගිකව හා නිවරදි ලෙස සිදුකරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගත්තේ බුද්ධෝත්පාද දේශනා මගිනි. බුද්ධ යනු කෙනෙක් පුද්ගලයෙක් නොව අනාත්ම ස්වභාවය වන අතර ධම්ම යනු අරමුණේ දෙයක් නැති බව ය. (එනම් පටිච්ච සමුප්පාද දහමය) සංඝ යනු අරමුණේ සත්‍ය දැක ඉන් මිදෙන මග ගමන් කිරීම ය. එසේ කරන්නා වු පිරිස ය. එහි දී ගිහි හෝ පැවිදි හෝ වශයෙන් වෙනසක් නැත.

බෞද්ධයන්ගෙන් වැඩි පිරිසක් බුදුන්වහන්සේ පුද්ගලභාවයකින් ගෙන කටයුතු කරති. තෙලින්, මලින් පුදති. එනම් බුදුන් වහන්සේට ආමිසයෙන් පුද පූජා පවත්වති. එයට ම මුල් තැන දෙති.

බුද්ධ ස්වභාවයට මුල්වරට පත් වූයේ එනම් ස්වයංභූ ඥාණයෙන් සත්‍ය අවබෝධ කොට වදාළේ අප තිලෝගුරු සම්මා සම්බුදු පියාණන් වහන්සේ ය. ඒ මග ගමන් කර බුද්ධ ස්වභාවයට පත් වන අනිකුත් උදවිය ශ්‍රාවක බුද්ධ ලෙස හැඳින්වේ.

ඔබ කවුරුන් ද?

දෙවියෙක් ද?

ගාන්ධර්වයෙක් ද?

යක්ෂයෙක් ද?

මනුෂ්‍යයෙක් ද? යි උපක නම් ආජීවකයා ඇසූ පැනයට බුදුන්වහන්සේ පිලිතුරු සපයන්නේ තමන් වහන්සේ ඒ කවරකු හෝ නොවන බව පැවසීමෙනි. මිනිසකු ලෙස උපත ලද්දේ නමුදු මිනිසත් බව ඉක්ම යාම මෙහි දී ඉදිරිපත් කෙරේ.

අරහත්ත සූත්‍රයේ සඳහන් වන ආකාරය ට යමෙක් මේ දහම අවබෝධ කරයි ද හෙතෙම බුද්ධ පුත්‍රයකු බවට පත් වේ. එනම් ශ්‍රාවක බුද්ධ වේ.

බොහෝ බෞද්ධයෝ බුදුන් වහන්සේ හා රහතන් වහන්සේලා බාහිරින් සොයන අතර තමා තුළ ඇති බුද්ධ ස්වභාවය හෙවත් අරහත්ත සමාධිය අවදි කර ගැනීමට උත්සහ නොකරති. ඒ සඳහා කුසලතාවයක් නොදක්වති.

එයට හේතුන් වනුයේ බුදු දහමේ දර්ශනය කාලයේ වැලි තලා වේ සැඟව යැම බව බුද්ධෝතපාද ආර්යයන්වහන්සේ පැහැදිලි කරන සේක.

"යො ධම්මං පස්සති සො මං පස්සති" යනු ධර්මය දකින්නා බුදුන් දකින බව ය. බුද්ධ ස්වභාවය යනු අනන්තය දක්වා ම විහිදුන අනුත්තර ස්වභාවයකි. ඒ බවට පත් වූ විට දෙදෙනෙකු හමු නොවේ. හෙවත් මා ද ඔබ ම ය. ඔබ ද මා ය. සැබවින් ම සියල්ලන් ම සමාන ය. අනාත්ම ස්වභාවය අත්දකින සියලු ම දෙනා තුළ එක ම ස්වභාවය එනම් සමාන ස්වභාවයක් හමු වේ.

බුද්ධ ස්වභාවයට අවදි වීමට නම් දර්ශනය සැක සංකා නොමැති ව ඉතා පිරිසිදුව අවබෝධ කර ගත යුතු ය. ඒ සඳහා උපනිශ්‍රය වන එක ම දහම් මග වනුයේ සැබෑ බුදු හඬ ප්‍රකාශිත බුද්ධෝත්පාද දේශනා ය. මේ මහා පණිවුඩය සැමට ශාන්තිය කැඳවනු නියත ය.

එමෙන් ම අප සියලු ම දෙනා බොහෝ කාලයක් තිස්සේ මේ සිත ලෝකය සැබෑ කර දැකීමේ අනුසෝතයේ ගමන් කර තිබේ. සිත පටිසෝතයට හැරවීමට නම් මූලික ව දර්ශනය අවබෝධ කළ යුතු ය. ඒ සඳහා බුදුන් වහන්සේ යම් ප්‍රතිපදාවක් ඉදිරිපත් කොට තිබේ. එම ප්‍රතිපදා මාලව බුද්ධෝත්පාදෝ දේශනාවලින් ඉදිරිපත් කර ඇත. පිළිවෙළින් සත්‍ය, කෘත්‍ය, කෘතඃ ලෙස මග පූරණය වීමෙන් දෙයක් කෙනෙක් නැති අනිමිත්ත ශුන්‍යත අප්පනිහිත චේතෝ විමුක්තිය හෙවත් බුද්ධ ස්වභාවයට පත් වීමට හැකියාව ලැබේ. එවිට ඇති වන්නේ නොසෙල්වන අකාරවතී ශ්‍රද්ධාවයි. එවැනි ස්වභාවයක දී නිතැතින් ම රැකෙන ආර්‍යකාන්ත සීලයේ පිහිටන බව දත යුතු ය.

ධර්මය සොයන්නාට බුදුන් හමුවේ යන්න පසක් කරමින් අප සියලු දෙනා මේ ලැබූ දුර්ලභ මනුෂ්‍ය ආත්මභාවය තුළ දීම බුද්ධ ස්වභාවයට අවදි වීමට අවශ්‍ය කුසලතාවය ඇති කර ගනිමු. මේ මහා සසර ඕඝයට තිත තබමු.

තෙරුවන් සරණයි !

**වින්ද්‍යා කරුණාතිලක**




# නිමාව

නිවන අහිමි ද ?
අස අසා
දුක්
කඳුළු මැද

කරදර ද
පොඩි කොට
බර - කරත්තය තුළ
ඔබ ඔබා
ගොනුන්
දක්කන කල
කරුමය දෙසට ම

අසුරු සැණයක් විය...
ඇසුණි!

ඒ මහා කරුණා
බුදු හඬ,
බුද්ධෝත්පාද නාමයෙන්,

ලිහා ගොනු,
හෙළා පසෙකට බර
තලා කරුමය
වීසි කෙළෙමි
පලය සාදන
හේතුව,

අහා...!

නොවී බරක්
තවත් රැගෙන යන්නට
භව ගමනක

**කුමුදිනී**

# සියපත

සියපතක් ! දිය මැද මලක් !
පිපී ගලනා මනා සුවඳක්
සුළඟ වී දුර දහස් ගව්වක්
හමා නිවමින් මහා ගින්නක්

ලොවේ වේ නම් කිසි කෙනෙක්
මෙවන් කරුණා අමා දම් පද
බෙදා සනහන ලෝ සතුන්
හෙතෙම වේ,
සම්බුදු රදුන්

**කව්මිණි**

# පනන්ගලටත් මෙත්මල් අරණක්

තේ දළු නෙලා ගෙට ආ කල දුක් කැටිය
හවහට කහට බී දර දිය ඇදි සැටිය
බත් නැති දිවට කොස් ඇට ගෙන දුනි රසය
දුප්පත් ගමකි, ඇති හැකි අය නැති හැටිය

මඟ නොමඟක් නො දැන යන එන ගම්මුන්ට
පිහිටක් වන්ට නැත කිසිවකු විමසන්ට
කාගෙත් දුකට හූලන උලලේනුන්ට
මිස වෙන කාට කියමු ද දුක දැනගන්ට

පිරිමින් සුරාවට හසු වී හමාර ය
මහමෙර සදිසි මව් දුක් ගිනි පදාස ය
දරු පැටියන්ට නැත එළියක් සැබෑව ය
පනන්ගල ගමයි, අඳුරයි සමාන ය

මේ ආකාරයට දින කාලය ගෙවුනා
කහ සිවුරක සුවය, ආලෝකය වැටුනා
මෙත් මල් වැටක මිණිමුතු එක ලෙස අමුනා
ආරාමයක මුදු සිසිලක සුව දැනුනා

පෙර පසු නොවී එක සිත දකිනා නුවණ
දෙන්නට මෙහෙණියක් ඇත දැන් පිං පුරන
මොහොතකි, ජීවිතය මායාවකි ය මන
දැන දැක වැඩුම ගෙන දෙනු ඇත අම නිවන

**ප්‍රියංකා**

# නිවන හිමි රටයි

| | |
|---|---|
| බුදුහිමි දෙසූ ඒ මනරම් නිවන් | මග |
| වෙනස් වෙලා අද ගලනව නොනිසි | මග |
| මග නොම වරදවා යන්නට හරිම | මග |
| සැරසෙමු පෙළ ගැසෙමු දැකුමට අමා | ගඟ |
| | |
| කොපමණ සතුරු කරදර පැමිණිය ද | රටේ |
| සොබා දම් රුදුරු උවදුරු හතර | වටේ |
| තිබුණත් බුදු දහම රැකගත් පුංචි | රටේ |
| යළි බැබළුනා සිරි සදහම් අපගෙ | රටේ |

**අනුලා දිසානායක**

# ආලෝකය



සත්‍ය දුටු සිත
අපූරුය එය,
නැතේ...

ඇලීමක් - ගැටීමක්
ප්‍රභාෂ්වරය
පළිගු මිණි සේ

විනිවිද යාය
සත්‍යයේ
මහා
ආලෝකය

දසත

නිවමින්
ලෝ සතුන්

**ප්‍රභානි**

# රතු අරලිය පැළය සහ "මම"

මා සහෝදරිය විදේශගත වන බැව් මහත් සතුටකින් දැන් වූවා ය. ඇය ඇය සතු සියලුම මල් පැළ රැගෙන යන ලෙස මට දැන් වූවා ය.

"මගේ මල් පැළ ඔක්කෝ ම ඔයා අරගෙන යන්න"
"හොඳයි", මම සතුටින් හිස වැනුවෙමි.

එසේ මාගේ ගෙමිදුලට පැමිණි රතු අරලිය මල් පැළය මා සේවය කරන විදුහලේ බුදු මැදුර අසළ සිටුවීමට සිතිවිල්ලක් පහළ විය. පරිත්‍යාග කිරීමේ ක්‍රියාවලිය සහ සිටුවීමේ ක්‍රියාවලිය එසේ නිම විය.

සේවා ස්ථානයේ බුදු මැදුර අසළින් ගමන් කරන සෑම මොහොතක ම රතු අරලිය පැළය වැඩෙන දෙස බලා උද්දාමයට පත් වන කවුරුන්දෝ සිටින බව වැටහිණි. එය වැඩෙනවා ද, වියළී යනවා ද, අවධානයෙන් සිටින, එසේ ම ඒ අසළ අසරණ ව කිසිවකුගේ විශේෂ ඇල්ම බැල්මෙන් තොරව වැඩෙන ඉද්ද, වතුසුද්ද, සමන්පිච්ච පැළ නොසළකා රතු අරලිය පැළය ට ම සලකන සහ අවධානය යොමු කරන රහස හඳුනා ගතිමි.

රතු අරලිය පැළය වැඩී මල් හටගත් පසු ඒ ගැන මහත් ප්‍රීතියෙන් කතා කරන්නා වූ කෙනා කවුරුන් ද? එසේ කතා කරන විට රතු අරලිය යන ශබ්ද සහ වර්ණ සංයෝගය විදේශ ගත සහෝදරිය දක්වා දුරවේදනය (ඔැකැච්එයස'ැ) වන අයුරු අත්වින්දෙමි. පරිත්‍යාගය පාරාවළල්ලක් වී 'ආත්මය' 'මමත්වය' බලවත් වන ආකාරය අත්වින්දෙමි. එසැනින් ම සත්‍ය ඥානයේ අනුහසින් සළායතන ක්‍රියාවලියේ පුදුමය දැනෙන්නට විය.

එනමුදු රතු අරලිය පැළය නිසා උද්දීපනයට, උද්දාමයට පත් නොවන එය සිතිවිල්ලක් බව හඳුනා මිදෙන 'මම' ඉතිරි විය. 'දදප සාකච්ඡාවල මෙම අත්දැකීම ප්‍රකාශ කිරීම තුළ ලද විග්‍රහ හා පැහැදිලි කිරීම් තුළින් නොදැනුවත් ව ම මුලා වී සිටි 'මම' හා අවබෝධාත්මක 'මම' යන සියල්ල සුන්නත්දූලි වී යන අයුරු අත්විඳිමි.

සාදු ! සාදු ! සාදු !
බුද්ධෝත්පාද ආර්යයන්වහන්සේගේ මහා අභිඥා ඥානයන්ට නමස්කාර වේවා!

**සුධර්මා ගමගේ**

# පද ප්‍රහේලිකාව






**හරහට**

1. අරමුණ විදගෙන යන නුවණින් දැකීම.
2. රකින්නට බැරි නමුත් අරමුණෙහි සත්‍ය දැක මිදෙන විට නිතැතින්ම රැකෙයි.
3. හේතුඵල දහම තුළ අවබෝධ කරන ධර්මතාවයන් තුනක්.
4. අරමුණෙහි සත්‍ය දකින විට නිතැතින්ම ඇති වෙයි.
5. පෘථග්ජනයාට නිසැකවම ඇති රෝගය.
6. අසූ භාරදාහක් ධර්මය දැකිය හැකි වන්නේ මේ තුලිනි.
7. නිමිත්තක් නොමැති බව.

**පහළට**

1. එන එන අරමුණෙන් මිදෙන විට සිදුවන භාවනාව.
8. හට ගන්න අරමුණෙහි සත්‍ය දැකීමට නොහැකි විට සිදුවන්නේ,
9. සිතක් මෙලෙසින් ද හඳුන්වයි.
10. සෑම බුදුවරයෙක් ම ලොව පහළ වී දේශනා කරන දහම.
11. අරමුණෙහි සත්‍ය දැකීම මෙලෙස හඳුන්වයි.
12. මෙම ඥානය නොමැති නම් අරමුණින් මිදීමටද නොහැක.
13. සියලු දෙයින් මිදෙන විට ඔබ අත්දකින්නේ මෙයයි.
14. ඇසෙන, පෙනෙන, දැනෙන නිසා සකස් වේ.
15. කෙලෙස් මෙලෙස ද හඳුන්වයි

# මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි

කාලයේ වැලිතලාවට සැඟව ගිය
ඒ පරම සත්‍යය හෙළි කරන්නට
සුදුසු මොහොත පැමිණෙමින් තිබේ.

ප්‍රඥා හිරු කිරණ දසත හමනවා.
දුකින් මිදෙන සිත් සැනසුම් සුසුමින් සැනසෙනවා.
සත්‍යයේ මහා සිංහ නාදය ඔබට ඇසෙනවා ද?
ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා,
විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකින්.
මේ දෝලනය වන ජීවිතය කුමක් ද?
ඔබ සත්‍යය දන්නේ නෑ.
සත්‍යය හෙළි කරන්නට අප සූදානම්.
මේ ඔබේ කථාවයි .
ඔබ සසර දුකින් මිදෙන කථාවයි .

සිතින් මිදෙන මග
දුකින් මිදෙන මග
නිවන් දකින මග
එයයි නිස්සරන මග....

තෙරුවන් සරණයි!